# ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

Final Draft - NCPA

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

Final Draft - NCPA

## පටුන


කෙටි යෙදුම් ........ ii

1. හැඳින්වීම ........ 1

1.1. පසුබිම සහ තාර්කිකය ........ 1

1.2. තත්ත්ව සමාලෝචනය ........ 3

1.2.1. ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් ........ 3

1.2.2. වර්තමාන තත්ත්වය ........ 5

2. ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ........ 7

2.1. හැඳින්වීම ........ 7

2.2. පාරිභාෂික වචන/ පද නිර්වචනය ........ 8

2.3. ප්‍රතිපත්තියේ මගපෙන්වීමේ මූලධර්ම ........ 10

2.4. ප්‍රතිපත්තියෙහි දැක්ම සහ මෙහෙවර ........ 10

දැක්ම ........ 11

මෙහෙවර ........ 11

2.5. ප්‍රතිපත්තියේ ඉලක්ක සහ අරමුණු ........ 11

2.6. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ........ 11

1 වෙනි ක්ෂේත්‍රය: සපයා දෙනු ලබන රැකවරණයෙහි ගුණාත්මකභාවය ........ 11

2 වෙනි ක්ෂේත්‍රය: වියදම් දැරිය හැකි ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා සමාජ සාධාරණ ප්‍රවේශය ........ 15

3 වෙනි ක්ෂේත්‍රය: ආබාධ සහිත ළමයින් සඳහා රැකවරණය ........ 16

4 වෙනි ක්ෂේත්‍රය: ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරණය ........ 16

5 වෙනි ක්ෂේත්‍රය: නියාමනය සහ පාලනය ........ 17

2.7 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යූහය ........ 18

2.7.1. කමිටුවල සංයුතිය ........ 18

2.8. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය හා සුපරීක්ෂණය ........ 21

2.9. පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරයන් සහ වගකීම් ........ 22


Final Draft- NCPA

## කෙටි යෙදුම්

| | |
|---|---|
| CDC | ළමා සංවර්ධන මධ්‍යස්ථාන |
| DCC | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු |
| Div.CC | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු |
| ECD | මුල් ළමාවිය සංවර්ධනය |
| FHB | පවුල් සෞඛ්‍ය කාර්යාංශය |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| ILO | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| MoH | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| NAITA | ජාතික ආධුනික හා පුහුණු කිරීමේ අධිකාරිය |
| NCC | ජාතික සම්බන්ධීකරණ කමිටුව |
| NCPA | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| NSECD | මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය |
| NVQ | ජාතික වෘත්තීය සුදුසුකම් |
| PCC | පළාත් සම්බන්ධීකරණ කමිටු |
| RPC | ප්‍රාදේශීය වැවිලි සමාගම් |
| UNCRC | එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය |
| TVEC | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |

Final Draft - NCPA

Final Draft - NCPA

# 1. හැඳින්වීම

## 1.1. පසුබිම සහ තාර්කිකය

ළමා රැකවරණය ළමයින්ගේ ජීවිතවල සහ පවුල්වල වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ළමයින් සම්බන්ධයෙන් බලන කල ගුණාත්මක ළමා රැකවරණයක් යනු ඔවුන්ගේ පරිපූර්ණ සංවර්ධනය සඳහා වන සහාය වීමකි. දෙමව්පියන්ට සහ පවුල්වලට අදාළව ගත් කල එමගින් ඔවුන්ගේ දරුවන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය අදහස් කෙරෙයි. මොළයේ මූලික සැකැස්ම උපතට පෙර ආරම්භ වී වැඩිහිටි අවධිය දක්වා සිදුවන අඛණ්ඩ ක්‍රියාවලියක් හරහා නිර්මාණය වන්නක් බව බුද්ධි සංවර්ධනය පිළිබඳ සිදුකරන ලද පර්යේෂණවලින් හෙළි වී තිබේ. මුල් කාලයේ ලබන අත්දැකීම් එම නිර්මාණයේ ගුණාත්මක තත්ත්වයට බලපාන අතර, ඒ අනුව එම අත්දැකීම් පසුකාලීන අධ්‍යාපනය, සෞඛ්‍යය සහ චර්යාවන් යන සියල්ල සඳහා ශක්තිමත් නැතහොත් දුර්වල පදනමක් ස්ථාපනය කරයි[1]. තවද, ළමයින් ඔවුන්ගේ පළමු වර්ෂය තුළ තම නිවසේ සිටීම මෙන්ම, ඉන්පසු වසරවලදී මනා ගුණාත්මක රැකවරණයෙන් සහ කණ්ඩායම් පසුබිමක් තුළ ලැබෙන අධ්‍යාපනයෙන් ඔවුනට යහපත් ප්‍රතිලාභ ලබාගත හැකි බවත් පර්යේෂණවලින් තවදුරටත් පෙන්වාදී ඇත[2]. එමෙන්ම ළමයින්ගේ සංවර්ධනයට සහ පාසලේ දී ජයග්‍රහණ ලබා ගැනීමට ගුණාත්මක රැකවරණය මගින් ලැබෙන ධනාත්මක හා කල්පවත්නා බලපෑම බොහෝ අධ්‍යයන මගින් තහවුරු කර තිබේ. මෙම අධ්‍යයනයන් මගින් තවදුරටත් අවධාරණය කරන පරිදි, ළමයින්ගේ සමාජීය, චිත්තවේගී, ප්‍රජානන හා භාෂා කුසලතා සංවර්ධනය වීම සඳහා ගුණාත්මක රැකවරණයක් තුළ ළමුන් හැදීවැඩීම යන්න තීරණාත්මක සාධකයක් වේ. ළමයින්ට එවැනි අත්දැකීම් ලබා දීමට දෙමව්පියන්ට නොහැකිවන විට, ඒ වෙනුවට යොදාගත හැකි හොඳම ආදේශකය වන්නේ ළමා රැකවරණ සේවාවන් ය. ගුණාත්මක ළමා රැකවරණ පරිසරයන් ආරක්ෂිත වන අතර, එමගින් අපයෝජන, නොසලකා හැරීම සහ මානසික ආතතියෙන් ළමයින්ව ආරක්ෂා කර, ඔවුන්ට ක්‍රීඩාව සහ තමන්ට වඩා වැඩි දැනුමක් ඇති වැඩිහිටියන් හා සම වයසේ මිතුරන් සමඟ අන්තර්ක්‍රියා කිරීම තුළින් ඉගෙනීම සඳහා බොහෝ අවස්ථා සපයා දෙයි.

එමෙන්ම ළමා රැකවරණය රටකට සමාජ සහ ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන ආයෝජනයක් ලෙස ද සළකනු ලැබේ. ළමයින්ගේ ධනාත්මක සංවර්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම සහ ආර්ථික සංවර්ධනය යන 'ත්‍රිත්ව ප්‍රතිලාභ' සහතික කිරීම සඳහා වියදම් දැරිය හැකි සහ ගුණාත්මක ළමා රැකවරණයකට ඇති විභවය අවධාරණය කිරීමේදී එය විශාල ආයෝජනයක් වන්නේය යනුවෙන් තර්ක කර ඇත[3]. ශ්‍රම බලකායට සහභාගී වීම කාන්තාවන් සවිබල ගැන්වීම උදෙසා දායකවන ප්‍රධානතම සාධකවලින් එකක් වේ. එමෙන්ම, එය රටක ආර්ථික සංවර්ධනයට දායකවන වැදගත් සාධකයක් ද වේ. කෙසේ වෙතත්, මෙවැනි වාසි තිබුණ ද, බොහෝ රටවල කාන්තාවන් ශ්‍රම බලකායට සහභාගී වීම අඩුවෙමින් පවතින බව ගෝලීය දත්තවලින් පෙන්නුම් කරයි. ලෝක බැංකුවට අනුව, එය විශේෂයෙන්ම මධ්‍යම සහ අඩු ආදායම් ලබන රටවල අවම අගයක් ගනී[4]. ගුණාත්මක ළමා රැකවරණ සේවා නොතිබීම මව්වරුන් ශ්‍රම බලකායෙන් ඉවත්ව සිටීමට ප්‍රධාන ම හේතුවක් ලෙස හඳුනාගෙන

[1]හාවාර්ඩ් විශ්වවිද්‍යාලය (n.d) සැකෙවින්: මුල් ළමාවිය සංවර්ධනයෙහි විද්‍යාව. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 30, https://developingchild.harvard.edu/resources/inbrief-science-of-ecd/

[2]විලෝහි, එම්. (2016) මුල් වසර වල රැකවරණයෙහි සහ අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය: මුල් වසර වල සේවාවෙන් අපේක්ෂා කළ යුතු දේ. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 25, https://www.tusla.ie/uploads/content/barnardos-quality_early_years_care_and-education.pdf

[3]යුනිසෙෆ් (2019) ළමා රැකවරණය සහ රැකියා කරන පවුල්: නව අවස්ථාවක් ද, නැතහොත් මගහැරුණු සබැඳියක් ද, තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 මැයි 26, https://www.unicef.org/sites/default/files/2019-07/UNICEF-Childcare%20-Family-Friendly-Policies-2019.pdf

[4]ලෝක බැංකුව (2021), ශ්‍රම බලකායට සහභාගීවීමේ අනුපාතය, කාන්තා (වයස අවුරුදු 15+ කාන්තා ජනගහනයෙහි %) (නිරූපකරණය කළ ලෝක කම්කරු සංවිධාන ඇස්තමේන්තු) ශ්‍රී ලංකාව,තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 18, (https://data.worldbank.org/indicator/SL.TLF.CACT.FE.ZS?locations=LK

තිබේ. වියදම් දැරිය හැකි ළමා රැකවරණ සේවා වැඩි ප්‍රමාණයක් තිබීම මව්වරුන් ශ්‍රම බලකායට සහභාගීවීමෙහි වැඩි අනුපාතයක් පෙන්නුම් කිරීමට හේතුවන අතර, විශේෂයෙන් ම පෙර පාසල් යන වයසේ ළමයින්ට ළමා රැකවරණ සේවා සැපයීම මව්වරුන්ට තෘප්තිමත් රැකියා-ජීවිත සමබරතාවයක් පවත්වා ගැනීමට උපකාරී වන බව අධ්‍යයන් මගින් පෙන්වා දෙයි[5].

2017 වර්ෂයේ දී 36.6 % ක් ව පැවති ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය 2019 වර්ෂය වනවිට 33.5% දක්වා අඩු වී ඇති බව ලෝක බැංකුව හෙළි කරයි. සමාජ-සංස්කෘතික සම්මතයන් සහ අවබෝධයන් කාන්තාවන් රැකියා අවස්ථා වෙත ප්‍රවේශ වීම කෙරෙහි කොතෙක් දුරට බාධා කරන්නේ ද යන්න ශ්‍රී ලංකාවේ කාන්තාවන් ශ්‍රම බලකායට සහභාගී වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳව ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් මෑතකදී සිදු කරන ලද අධ්‍යයනයක්[6] මගින් ද හෙළි වී තිබේ. ගෘහස්ථ වගකීම් හා සම්බන්ධ ස්ත්‍රී-පුරුෂ සමාජභාව ඒකාකෘති රැකියාවල නියැළීමේ ක්‍රියාවලියේ දී වක්‍ර ලෙස වෙනස් කොට සැලකීමට හේතු වී ඇති බව මෙම අධ්‍යයනය මගින් සොයා ගෙන ඇත. එයට පිළියමක් ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් යෝජනා කර ඇති එක් ක්‍රියාමාර්ගයක් වන්නේ කාන්තාවන්ට දැරීමට සිදුවන, ගෙවීමක් නොලැබෙන රැකවරණ වැඩවල බර අඩුවන පරිදි දැරිය හැකි මිලකට (සමහර විට රජයේ අරමුදල් යෙදවීම මත) රැකවරණ  සේවා සපයා දීමයි.

සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජය තුළ විස්තෘත පවුල් බහුලව දක්නට ලැබුණු අතර, ළමයින් රැකබලා ගැනීමේ දී පූර්වජනකයින් (ආච්චි, සීයා) වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත. කෙසේ වෙතත්, වර්තමානයේ දී මෙම භූමිකාව මෙන්ම යැපීමේ අනුපාතය ද වෙනස් වී ඇති අතර, දෙමව්පියන්ට තම ළමයින්ගේ මෙන්ම පවුලේ වයස්ගත අය රැකබලා ගැනීමේ වගකීම ද පැවරී ඇති බව මෑතකාලීන අධ්‍යයනයක්[7] මගින් පෙන්වා දී තිබේ. දකුණු ආසියාවේ වඩාත්ම ශීඝ්‍රයෙන් වයස්ගත ජනගහනය වැඩි වෙමින් පවතින රට  ශ්‍රී ලංකාව වීම මගින් සහ මෙය බෝ නොවන රෝග වැඩිවීම සමඟ සම්බන්ධ වී පැවතීම මගින් පූර්වජනකයින් වයස්ගත තත්ත්වයේ සිටින බව සහ ඒ නිසා ඔවුන්ගේ මුණුපුරු මිණිපිරියන්  රැකබලා ගැනීමේ හැකියාව අඩු වී ඇති බව එයින් අදහස් වන්නේ යැයි මෙම අධ්‍යයනය මගින් පෙන්වා දී තිබේ. ඒ අනුව, පවුලෙන් ලැබෙන සහයෝගය අඩුවීමත් සමඟ ශ්‍රී ලාංකික පවුල්වලට නිවෙස පාදක ළමයින් රැකබලා ගැනීමේ ක්‍රමය දුෂ්කර කරුණක් වී ඇත.

“ළමයින් සහ යෞවනයන් කායික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සමාජීය වශයෙන් පූර්ණ සංවර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදාගනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ සුභසිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කළ යුතුය.”  (VI වන පරිච්ඡේදය, 27 [13] වැනි ව්‍යවස්ථාව) යනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රජයේ ප්‍රතිපත්තියෙහි මඟ පෙන්වීමේ මූලධර්මවල ප්‍රකාශයට පත්කර තිබේ. තවද, 1990 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අත්සන් කර එහි පාර්ශ්වකාර රාජ්‍යයක් බවට පත් විය. පසුව, 1992 දී ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය හඳුන්වා දෙන ලදී. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි සහ ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙන ලද ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි පැහැදිලිව දක්වා ඇති පරිදි, අපයෝජනයෙන්, නොසලකා හැරීමෙන් සහ සූරාකෑමෙන් තොරව සිටීම සඳහා ළමයින්ට ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම පිණිස කලින් කලට බලයට පත්

[5] ඩැනියෙලා වූරි (2016) ළමා රැකවරණ ප්‍රතිපත්ති මාතෘ සේවා නියුක්තිය වැඩි කරන්නේද, IZA World of Labor. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 6, https://wol.iza.org/uploads/articles/241/pdfs/do-childcare-policies-increase-maternal-employment.one-pager.pdf

[6] ජාත්‍යන්තර කම්කරු සංවිධානය (2016), කාන්තාවන් ශ්‍රම බලකායට සහභාගීවීම කෙරෙහි බලපාන සාධක, තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 15, https://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo- colombo/documents/publication/wcms_551675.pdf

[7] වර්ණසූරිය, ආර්. (ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින ළමා රැකවරණ සහාය අවශ්‍යතාවය 2020), තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 මැයි 17, https://blogs.worldbank.org/endpovertyinsouthasia/growing-need-childcare-support-sri-lanka

Final Draft - NPA

වූ රජයන් විසින් විවිධ ප්‍රතිපත්ති රාශියක් හඳුන්වා දී ඇත. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආමන්ත්‍රණය සඳහා වන ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020), ශ්‍රී ලංකාවේ ළමයින් රැකබලා ගැනීම සඳහා වන ජාතික විකල්ප ප්‍රතිපත්තිය 2019, ජාතික ළමා ආරක්‍ෂක ප්‍රතිපත්තිය 2019, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2018, සහ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2017 එම ප්‍රතිපත්තිවලට ඇතුළත් වේ. මෙම ප්‍රතිපත්තිවලට අමතරව රජය විසින් ළමයින්ට ආරක්‍ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමට අදාළ ජාතික මාර්ගෝපදේශයක් 2017 වසරේදී හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සහතික කිරීමේ ඉතිහාසයේ එක් සුවිශේෂී නීතියක් වන්නේ 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්‍ෂක අධිකාරිය පනතයි. ඒ අනුව මෙම පනත යටතේ, ළමා අපයෝජන වැළැක්වීම සඳහා සහ එවැනි අපයෝජනයන්ට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහාත්; සෑම ආකාරයකම ළමා අපයෝජනවලට එරෙහි ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහාත්; ඒ හා සම්බන්ධ හෝ එයට අනුෂාංගික කරුණු සඳහාත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී. පනතෙහි 14 වැනි වගන්තියෙහි දක්වා ඇති පරිදි මෙම අධිකාරියෙහි ප්‍රධාන කර්තව්‍යය වන්නේ ළමා අපයෝජනය වැළැක්වීම පිළිබඳව සහ එවැනි අපයෝජනවලට ගොදුරුවන ළමුන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට ප්‍රතිකාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ දී රජයට උපදෙස් ලබා දීමයි. එම පනතට අනුව, ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් ප්‍රමිතිකරණය කිරීම, හැසිරවීම සහ අධීක්ෂණය සඳහාත්, ළමයින් සඳහා ඇති අවදානම් අවම කිරීම සඳහාත්, ළමයින් සඳහා ගුණාත්මක ළමා දිවා සුරැකුම් සේවා ප්‍රවර්ධනය කිරීම සඳහාත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඉදිරිපත් කරයි.

## 1.2. තත්ත්ව සමාලෝචනය

### 1.2.1. ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම්

විශ්වාසනීය දත්ත හිඟකම මගින් ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ඓතිහාසික පරිණාමය සහ වර්තමාන තත්ත්වය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඉදිරිපත් කිරීම සීමා කරයි. 2010 වසරේ දී ශ්‍රී ලංකාවේ පළාත් නවය ම ආවරණය වන පරිදි ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳව සිදුකරන ලද එක් සමීක්ෂණයක් හැරෙන්නට, මෑතක දී ජාතික මට්ටමෙන් සිදුකරන ලද අධ්‍යයන නොතිබුණි. 2010 වර්ෂයේදී සිදුකරන ලද එම සමීක්‍ෂණය මගින් ශ්‍රී ලංකාවේ තිබෙන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳව මෙන්ම, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින් දිවා සුරැකුම් සපයා දීමේ ප්‍රමාණය පිළිබඳව ද දත්ත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, උතුරු හා නැගෙනහිර පළාත් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය ඇතුළත් නොකිරීමෙන් සහ දකුණු, උතුරු මැද සහ ඌව වැනි සමහර පළාත් නියෝජනය වීම සීමා සහිත වීම මගින් එම සමීක්ෂණය සීමා වී තිබුණි[8]. මෙම සමීක්‍ෂණයට අමතරව, ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම්වල තත්ත්වය සමාලෝචනය කිරීමේ දී මුල් ළමාවිය සංවර්ධනය සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයෙන් ලබා ගත් දත්ත ද උපකාරී විය.

*ළමා දිවා සුරැකුම් පහසුකම් වර්ග*

Final Draft NCPA

[8]ළමා ලේකම් කාර්යාලය (2010), මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික සමීක්ෂණය, ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 මැයි 7,http://www.childprotection.gov.lk/documents/National%20Child%20Protection%20Policy%20-%20final%20-%202013.10.4.pdf -

ජාතික සමීක්ෂණයේ (2010) සඳහන් වන පරිදි, ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් බිහිවීම බොහෝ දුරට කාන්තාවන් රැකියාවල නිරතවීම, ළමයින් රැකබලා ගැනීමට දෙමාපියන්ට උපකාර කිරීම සඳහා ගෘහ සේවකයින් නොමැතිකම සහ විස්තෘත පවුල් සංඛ්‍යාව අඩු වීම ආදී හේතු නිසා සිදුවිය. එවැනි පවුල්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ළමයින් රැකබලා ගැනීමේ කාර්යය ඉටුකර දෙන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන වර්ග කිහිපයක් තිබේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සම්පාදනය කරන ලද ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික මාර්ගෝපදේශ මගින් මෙම මධ්‍යස්ථාන කාණ්ඩ 3ක් යටතේ පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත:

(අ) මධ්‍යස්ථාන පදනම් කරගත් ළමා දිවා සුරැකුම්,
(ආ) සේවා ස්ථාන පදනම් කරගත් ළමා දිවා සුරැකුම්, සහ
(ඇ) නිවාස පදනම් කරගත් ළමා දිවා සුරැකුම්.

මධ්‍යස්ථාන පදනම් කරගත් ළමා දිවා සුරැකුම් පහසුකම්වල ළදරුවන්, සිඟිත්තන්, පෙර පාසල් ළමයින් සහ පාසල් යන වයසේ ළමයින් සඳහා රැකවරණ සේවා සපයාදෙන අතර, එම මධ්‍යස්ථාන පෙ.ව. 7.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා ළමයින්ට පෙර පාසලක් ද පවත්වන හෝ නොපවත්වන ස්ථාන විය හැක. රජය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් කළමනාකරණය කරනු ලබන, ළමයින්ට විනෝද ක්‍රියාකාරම්වල නිරත වී සිටිය හැකි මධ්‍යස්ථාන ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. මෙම මධ්‍යස්ථාන ක්‍රියාත්මකව පවතින වේලාවන් දෙමාපියන්ගේ අවශ්‍යතා අනුව සහ ඒවායෙහි කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ධාරිතාවයන් අනුව වෙනස් විය හැකිය. කෙසේ වෙතත්, මෙම මධ්‍යස්ථාන ප.ව.6.00 වනවිට වසනු ලැබේ.

සේවා ස්ථාන පදනම් කරගත් ළමා දිවා සුරැකුම් පහසුකම් සේවා ස්ථානයක වැඩ කරන වේලාවන් තුළ ක්‍රියාත්මකවන පරිදි එම ආයතනයේ සේවකයින් හෝ සේවා යෝජකයින් විසින් පිහිටුවනු ලැබේ. පාසල් බලධාරීන් විසින් පවත්වනු ලබන, පාසල් කාලයෙන් පසු ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. සේවා ස්ථානවල සේවා යෝජකයින් හෝ සේවකයින් විසින් කළමනාකරණය කරනු ලබන ළමා දිවා සුරැකුම් පහසුකම් සේවකයින්ගේ හා සේවා යෝජකයන්ගේ අවශ්‍යතා මත සති අන්තයේ දී වුව ද ක්‍රියාත්මක විය හැකිය.

පෞද්ගලික නිවාස පදනම් කරගත් ළමා දිවා සුරැකුම් පහසුකම් දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ නිවස හැර වෙනත් පෞද්ගලික නිවාසවල පැය 2 ට වඩා වැඩි කාලයක් පුරා සේවාවන් සපයාදෙනු ලැබේ. බොහෝ අවස්ථාවල දී, රැකවරණය සපයන්නන් විසින් සපයා දෙනු ලබන මෙම සේවාවන් සඳහා දෙමව්පියන් විසින් ගෙවීමක් කළ යුතු වේ.

### *වතු අංශයේ ළමා දිවා සුරැකුම් පහසුකම්*

වතු ආශ්‍රිතව සපයාදෙනු ලබන ළමා දිවා සුරැකුම් පහසුකම් සේවා ස්ථාන පදනම් කරගත් ඒවා වුවද, එම පහසුකම් අනෙකුත් සේවා ස්ථානවල සපයාදෙනු ලබන ළමා දිවා සුරැකුම් සේවාවලට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වේ. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ දී වතුවල ඉහළ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වයක් තිබීමෙහි ප්‍රතිඵලයක් ලෙස බිහිවුණු මෙම ළමා දිවා සුරැකුම් පහසුකම්වලට සියවසකටත් වඩා වැඩි කාලයක ඉතිහාසයක් ඇත. එම කාලයේ දී ළමයින් සඳහා එවැනි ළමා දිවා සුරැකුම් පහසුකම් හඳුන්වා දීමේ අරමුණ වූයේ දෙමව්පියන් වතුවල සේවය කරන කාලය තුළ එම ළමයින්ව රැකබලා ගැනීමයි. මෙම පහසුකම් 'පුල්ලේ මඩු' ලෙස හැඳින් වූ අතර, ළමයින් රැක බලා ගනු ලැබුවේ විශ්‍රාමික සේවිකාවක හෙවත් පුල්ලේ අම්මා විසිනි. මෙම පහසුකම් මගින් ළමයින්ගේ උත්තේජනය, වර්ධනය සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු නොකර, ළමයින් රැකබලා ගැනීමේ සේවා

Final Draft - NCPA

පමණක් සපයා දී ඇත[9]. කෙසේ වෙතත්, නිදහස් අධ්‍යාපනය පුළුල් වීමත්, ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වැවිලි අංශයේ වෘත්තීය සමිතිවලින් සමන්විත ත්‍රෛපාර්ශ්වික සංවිධානයක්වන වැවිලි මානව සංවර්ධන භාරය පිහිටුවීමත් සමඟ මෙම තත්ත්වය වෙනස් වී ඇත. වර්තමානයේ 'පුල්ලේ මඩු' ළමා සංවර්ධන මධ්‍යස්ථාන බවට පරිවර්තනය වී ඇති අතර, අවුරුදු 3-5 අතර වයසේ ළමයින් සඳහා පෙර පාසල් අධ්‍යාපනය ලබාදීම එම මධ්‍යස්ථානවල සේවාවන්හි කොටසක් බවට පත් වී ඇත. මෙම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය තමන්ගේම මාර්ගෝපදේශ සකස් කර ඇත.

### 1.2.2. වර්තමාන තත්ත්වය

මෙම ලියවිල්ලෙහි කලින් සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් පිළිබඳ ඇති දත්ත ඉතා අල්ප වේ. එයට හේතුව ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ පහසුකම් පිළිබඳ පර්යේෂණ නොමැති වීම විය හැකිය. එමෙන්ම, ළමා දිවා සුරැකුම් සේවා ලියාපදිංචි කිරීම සම්බන්ධ අපැහැදිලි බවක් ද තිබේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් හඳුන්වා දී ඇති ළමා දිවා සුරැකුම් පිළිබඳ ජාතික මාර්ගෝපදේශවලට අනුව, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත්, බොහෝ පළාත්වල, අවුරුදු පහට අඩු ළමුන් සඳහා සේවා සපයා දෙන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පෙර පාසල් අධ්‍යාපනය සඳහා ස්ථාපිත කර ඇති නියාමන ආයතනවල ලියාපදිංචි කර ඇත. ඌව පළාතේ, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ වයස අවුරුදු පහට අඩු ළමයින්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය හා ආරක්ෂාව සපයා දීම සඳහා පවත්වනු ලබන වෙනත් ඕනෑම මධ්‍යස්ථානයක් මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි විය යුතුය[10]. තවද, ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පළාත් දෙපාර්තමේන්තුවල ව්‍යාපාර වශයෙන් ලියාපදිංචි කර ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද ඇත. මෙම අපැහැදිලිතාවය මෙන්ම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳව සිදු කර ඇති සීමිත අධ්‍යයනයන් හේතුවෙන් වර්තමාන තත්ත්වය වඩාත් නිවැරදිව විස්තර කිරීම දුෂ්කර වී තිබේ. කෙසේ වෙතත්, එවැනි සීමාවීම් තිබියදීත්, ශ්‍රී ලංකාවේ ඇති ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ එම මධ්‍යස්ථානවලට ඇතුළත් වී ඇති ළමයින් සංඛ්‍යාව පිළිබඳ මෑතකාලීන දත්ත ලබාදීමට මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට හැකිවිය. මෙයට දශකයකට පෙර සිදුකරනු ලැබූව ද, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික සමීක්ෂණය ද රට තුළ පවතින ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ පරිපූර්ණ අදහසක් ලබා ගැනීමට දායක වූ ප්‍රයෝජනවත් තොරතුරු මූලාශ්‍රයක් විය. මෙම මූලාශ්‍රවලින් රැස්කර ගන්නා ලද දත්ත මගින් පහත කරුණු හෙළිදරව් කරයි:

- 2016 වර්ෂයේ දී, දිවයින පුරා ළමුන් 23,365 දෙනෙකු සඳහා සේවා සපයා දුන් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන 1,209 ක් තිබුණි. මෙම මධ්‍යස්ථානවලින් බහුතරයක් කොළඹ (189) සහ කුරුණෑගල (200) යන දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.
- 2010 වර්ෂයේ දී සිදුකරන ලද ජාතික සමීක්‍ෂණයට අනුව, ශ්‍රී ලංකාවේ ඇති ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පෞද්ගලික ආයතන හෝ පුද්ගලයින්, රාජ්‍ය ආයතන, ආගමික සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් කළමනාකරණය කරනු ලැබේ. එයින් බහුතරය කළමනාකරණය කරනු ලබන්නේ පෞද්ගලික අංශය විසිනි. මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින් බහුතරයක (56%) ගාස්තු අය කරනු ලැබේ. කෙසේ වෙතත්, සුභසාධන මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මකවන, ගාස්තු අය නොකරන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද ඇත.
- මෙම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින් බහුතරයක සන්නිවේදන මාධ්‍යය මව් භාෂාව වේ(73%). කෙසේ වෙතත්, මධ්‍යස්ථානයේ ළමයින් සමඟ සන්නිවේදනය කිරීම සඳහා භාෂා දෙකක සංකලනයක් (සිංහල සහ දෙමළ/සිංහල සහ ඉංග්‍රීසි/දෙමළ සහ ඉංග්‍රීසි) භාවිතා කරන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන තිබේ.
- සමහර ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රමාණවත් ගෘහස්ථ හා එළිමහන් ඉඩකඩ ප්‍රමාණයක් නොමැතිව ක්‍රියාත්මකවන බව 2010 ජාතික සමීක්‍ෂණය මගින් හෙළිදරව් කරයි. එමෙන්ම, මෙම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන තුළ සුදුසු ගෘහස්ථ

[9] වර්ණකුලසූරිය, ආර්., සොසේල්, එස්., ඩේයි, එස්. (2020) ශ්‍රී ලංකාවේ මුල් ළමා විය රැකවරණය සහ අධ්‍යාපනය සංකලනය කිරීම. තොරතුරු ලබාගත් වෙබ් අඩවිය: https://openknowledge.worldbank.org/bitstream/handle/10986/34646/9781464816185.pdf

[10] ඌව පළාත් සභාව (2017),මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ ප්‍රඥප්තිය. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021ජූලි 1, https://www.up.gov.lk/images/2017/01/1706_10-E.pdf

Final Draft - NCPA

හා එළිමහන් උපකරණ සහ ඉගෙනුම් ද්‍රව්‍ය පිළිබඳ තත්ත්වය සතුටුදායක නොවන බව ද සමීක්ෂණය වාර්තා කරයි. අඩු ආදායම්ලාභී ප්‍රජාවන් තුළ පවා මෙම පහසුකම් සපයා දීම සඳහා දෙමාපියන්ගේ සහයෝගය ලබා ගත හැකි ව තිබෙන නමුත් උදාසීනභාවය සහ උනන්දුවක් නොමැතිකම එම මධ්‍යස්ථානවල මෙම අත්‍යාවශ්‍ය  ද්‍රව්‍ය නොතිබීමට හේතු වී ඇති බව ද එම වාර්තාවෙහි සඳහන් වේ.

- ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සේවය කරන රැකවරණය සපයන්නන් ඔවුන්ගේ රැකවරණය යටතේ තබා ඇති ළමයින්ගේ සුරක්ෂිතභාවය, රැකවරණය සහ ආරක්ෂාව සැලසීමේ වගකීම දරයි. ඔවුන්ට ළමා රැකවරණය පිළිබඳ නිසි පුහුණුවක් තිබිය යුතු වේ. කෙසේ වෙතත්, මෙම රැකවරණය සපයන්නන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (43%) ළමයින් රැකබලා ගැනීම පිළිබඳ කිසිදු පුහුණුවක් ලබා නොමැති බව 2010 සමීක්ෂණය මගින් හෙළි කර ඇත. නිසි අධීක්ෂණ ක්‍රමවේදයක් නොමැති බැවින් අදටත් මෙම තත්ත්වය වෙනස් වී තිබේද යන්න සැක සහිත ය.
- බොහෝ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන මගින් ළමයින්ට ආහාර ලබා නොදෙයි. බහුතරයක් ළමයින් නිවසින් ආහාර ගෙන එයි.
- නිතර දෙමව්පිය රැස්වීම් පැවැත්වීම අත්‍යවශ්‍ය වුවද, 2010 ජාතික සමීක්ෂණය මගින් ආවරණය කරන ලද මධ්‍යස්ථානවලින් අඩක පමණක් මාසික රැස්වීම් පැවැත්වෙන බව ද හෙළි කර තිබේ. මෙම තත්ත්වය දෙමාපියන් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ක්‍රියාකාරකම්වල කොටසක් වීම වළක්වාලයි.

මිල දැරිය හැකි වීම, ප්‍රවේශ වීමේ හැකියාව තිබීම, විශ්වාසය සහ ගුණාත්මකභාවය ළමා රැකවරණ සේවා වෙත ප්‍රවේශ වීම සීමා කෙරෙන ප්‍රධාන බාධාවන් වන බව ගෝලීය පර්යේෂණවලින් හෙළිදරව් කර තිබේ. මෙම සීමාවීම් ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවලට පොදු ය. 2018 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද,'ළමා රැකවරණය සම්බන්ධයෙන් කටයුතු කිරීම: ශ්‍රී ලංකාවේ සේවා යෝජකයින්ගේ සහාය ඇතිව සපයා දෙනු ලබන ළමා රැකවරණයෙහි ව්‍යාපාරික වාසිදායක බව'[11] නැමති වාර්තාව මගින් 'දැරිය හැකි මිලකට ගුණාත්මක ළමා රැකවරණ සේවා ලබා ගැනීමට නොහැකි වීම බොහෝ දෙමව්පියන්ව වැටුප් ලබන රැකියාවල අඛණ්ඩව නිරත වීම හෝ නැවත රැකියාවට පැමිණීම වළක්වයි' යනුවෙන් සඳහන් කරමින් මෙම බාධාවන් නැවත අවධාරණය කර ඇත. සේවකයින් සඳහා ප්‍රවේශ විය හැකි ළමා රැකවරණ සේවා නොමැති තත්ත්වයක් තුළ, ශ්‍රී ලංකාවේ සේවා යෝජකයින් පුහුණු ශ්‍රමිකයින් බඳවා ගැනීමේ හා සේවයේ රඳවා ගැනීමේ දුෂ්කරතාවන්ට මෙන්ම, සේවයට නොපැමිණීමේ ඉහළ අගයන්, මාතෘත්වය ලැබීමෙන් පසු ආපසු සේවයට පැමිණීමේ අනුපාතය අඩුවීම සහ නායකත්ව මට්ටම්වල ප්‍රමාණවත් විවිධත්වයක් නොතිබීම වැනි ගැටලුවලට මුහුණ දෙන බව ද එහි සඳහන් වේ. මෙම තත්ත්වය තුළ, රැකියාවල නියුතු දෙමව්පියන්ගේ ළමයින් සඳහා දැරිය හැකි මිලකට, උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් පහසුකම් අවස්ථා පුළුල් කිරීම අත්‍යාවශ්‍ය වේ.

වර්තමානය වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් රට තුළ පැවති කාලීන අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින්  ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශ හඳුන්වා දී තිබේ (ඇමුණුම 01 බලන්න). ඒ සඳහා 2017.7.25 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇත. උක්ත ජාතික මාර්ගෝපදේශයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ:

- වයස මාස 4 සිට අවුරුදු 12 දක්වා වූ ළමයින් සඳහා වෘත්තීයමය සහ සුරක්ෂිත ළමා දිවා සුරැකුම් සේවා ප්‍රවර්ධනය කිරීම.
- දිවයින පුරා පිහිටි සියලුම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය සහතික කරන ලද, ප්‍රමිතිගත ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරනු ලැබීම සහතික කිරීම.
- ළමයින්ගේ රැකවරණය සහ ළමයින්ගේ සමස්ත සංවර්ධනාත්මක අවශ්‍යතා සපුරාලීම සහ ඒවා ඔවුන්ගේ සංවර්ධන අභිමතාර්ථවලට අනුකූල වන බව සහතික කිරීම.

[11]ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (2018). 'ළමා රැකවරණය සම්බන්ධයෙන් කටයුතු කිරීම: ශ්‍රී ලංකාවේ සේවා යෝජකයින් ගේ සහාය ඇතිව සපයාදෙනු ලබන ළමා රැකවරණයෙහි ව්‍යාපාරික වාසිදායක බව'. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021ජූනි 2,https://www.ifc.org/wps/wcm/connect/fe0a2fa6-6dde-483a-be75-48c0cc66ceb2/Report.pdf?MOD=AJPERES&CVID=mulpGtj

Final Draft NCPA

- නියම කර ඇති අවම ප්‍රමිතීන්ට ළඟා වීමේ හැකියාව සහිත ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහාත්, පවතින මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම සඳහාත් මාර්ගෝපදේශ සපයා දීම.

ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශය ළමා දිවා සුරුකුම් පහසුකම් සැපයීමේ ක්ෂේත්‍රයට අදාළ සියළුම පාර්ශවකරුවන්ගේ සහ අදාළ විශේෂඥයන්ගේ අදහස් විමසා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ හා මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලයේ සහයෝගීත්වයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූලිකත්වය ඇතිව සම්පාදනය කරන ලදී. එමගින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ විධිමත් ක්‍රියාවලිය, අවම ප්‍රමිතීන් සහ අධීක්ෂණ කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදී ඇති අතර ජාතික මාර්ගෝපදේශය යටතේ ළමා රැකවරණය සම්බන්ධ පහත සඳහන් මූලික අංශ 15ක් ආවරණය කරනු ලබයි.

1. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම
2. ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය
3. කාර්ය මණ්ඩලය සැපයීම
4. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන භෞතික පරිසරය
5. රැකවරණය, ඉගෙනීම සහ ක්‍රීඩා
6. සෞඛ්‍යය සහ ආරක්ෂාව
7. ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව
8. විවිධත්වය සහ සමාන අවස්ථා
9. ආබාධ සහිත ළමයින්
10. පුද්ගලික නිවාස ආශ්‍රිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන
11. ළමයින් භාරදීමේ මධ්‍යස්ථාන
12. දෙමව්පියන්/භාරකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
13. වාර්තා තබා ගැනීම
14. අධීක්ෂණය සහ පැමිණිලි
15. වෙබ් අඩවි පාදක තොරතුරු මධ්‍යස්ථානය

ජාතික මාර්ගෝපදේශ හඳුන්වාදීමට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ එක්ව ළමා රැකවරණය සපයා දීම පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටම දක්වා වන විෂය මාලාව සංවර්ධනය කර හඳුන්වාදී ඇත. මෙම විෂයමාලාව ළමයින්ට සපයාදෙන රැකවරණයෙහි ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කරන බැවින් ළමා රැකවරණය සපයන්නන් වීමට කැමැත්තක් දක්වන අය සඳහා මෙම විෂයමාලාව අනිවාර්ය කළ හැක.

## 2. ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

### 2.1. හැඳින්වීම

මෙම පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ ළමයින් සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් සේවා ප්‍රවර්ධනය කිරීම පිණිස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකාවේ ළමයින් සඳහා සපයනු ලබන සියලුම ළමා දිවා සුරැකුම් සේවා සඳහා එය අදාළ වේ. මෙම ජාතික ප්‍රතිපත්තිය හරහා ශ්‍රී ලංකා රජය ළමයින්ට, විශේෂයෙන්ම සේවා නියුක්ත දෙමව්පියන්ගේ ළමයින්ට, සමාජ සාධාරණ හා වියදම් දැරිය හැකි මිලකට දිවා සුරැකුම් පහසුකම් සහතික කිරීම සඳහා ළමා දිවා සුරැකුම් සේවා දියුණු කිරීමට සහ නියාමනය කිරීමට අවශ්‍ය කොන්දේසි නිර්මාණය කරයි. මෙය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමෙන් පසුව, තමන්ගේ ළමයින්ට රැකවරණය සැපයීම සඳහා සුපෝෂිත පරිසරයක් සොයන සියලුම දෙමාපියන්ගේ සහ පවුල්වල අවශ්‍යතා සපුරාලීම සඳහා සාධාරණ හා දැරිය හැකි මිලකට උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් පහසුකම් සපයා දීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන පහත සඳහන් පියවර පහ ආවරණය කරමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ යෝජිත ජාතික ප්‍රතිපත්තිය සකස් කර ඇත:

(අ) දැරිය හැකි මිලක ට ළමා දිවා සුරැකුම් සේවා සඳහා සමාජ සාධාරණ ප්‍රවේශය

Final Draft-NCPA

(ආ) මධ්‍යස්ථානවල ළමයින් සඳහා සපයනු ලබන රැකවරණ සේවාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

(ඇ) ආබාධ සහිත ළමයින් රැකබලා ගැනීම

(ඈ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරණය

(ඉ) නියාමනය සහ පාලනය

යෝජිත උපාය මාර්ග සමඟ මේ සෑම අංශයක් සඳහාම ප්‍රතිපත්ති නිශ්චිතව දක්වා ඇත. සියලුම පාර්ශවකරුවන්ගේ භූමිකා සහ වගකීම් සඳහන් වන ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහයක් ද ප්‍රතිපත්තියේ ඉදිරිපත් කර ඇත.

Final Draft- NCPA

## 2.2. පාරිභාෂික වචන/ පද නිර්වචනය

**රැකවරණය සලසන්නෙක්** යනු ළමයින් සඳහා සෘජු රැකවරණය සපයන පුද්ගලයෙකි[12]. ඔහු/ඇය ළමයින්ට ආහාර වේල් සපයා දීම වැනි මූලික අවශ්‍යතා සපයා දීම, ඇඳුම් ඇන්දවීම, ළමයි ක්‍රීඩා කරන විට අධීක්ෂණය කිරීම, ළමයින්ව පිරිසිදු කිරීම හා සිදුවිය හැකි සියලුම හානිවලින් ඔවුන්ව ආරක්ෂා කිරීම වැනි ළමයින්ගේ අවශ්‍යතා ඉටුකර දෙයි. රැකවරණය සපයන්නන් තම රැකවරණය යටතේ සිටින ළමයින්ට ප්‍රයෝජනවත් ඉගෙනුම් පරිසරයක් ද සපයා දිය යුතුය.

**ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය** යනු පෙර පාසල් වයසේ පසුවන ළමයින්ගේ දෙමාපියන්ට ඔවුන්ගේ රැකියාවේ නියුක්ත වීමට හැකි වන පරිදි එම ළමයින් සඳහා ළමා දිවා සුරැකුම් පහසුකම් සපයා දෙන ආයතනයක් වේ[13]. මෙම මධ්‍යස්ථාන සේවා ස්ථානවල හෝ නිවාස/පවුල්වල නිශ්චිත කාලයන් තුළ ක්‍රියාත්මක කළ හැකිය. මෙම ප්‍රතිපත්තියේ දී ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය යන්න ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් හඳුන්වා දී ඇති ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික මාර්ගෝපදේශවල දක්වා ඇති මාස 4 සිට අවුරුදු 12 දක්වා වූ වයස් සීමාව තුළ සිටින සියලුම ළමයින් සඳහා දිවා සුරැකුම් සේවා සපයා දෙන මධ්‍යස්ථාන ලෙස අර්ථ දක්වනු ලැබේ.

**ආබාධ සහිත ළමයින්** යනු යම් යම් ක්‍රියාකාරකම් සිදු කිරීම අපහසු කරවන (ක්‍රියාකාරකම් සීමා කරන) හා අවට ලෝකය සමඟ අන්තර් ක්‍රියා කිරීම අපහසු කරවන (සහභාගීවීම සීමා කරන) ශරීරයේ හෝ මනසේ ඇති ඕනෑම

---

[12] Merriam-Webster ශබ්ද කෝෂය."Caregiver."තොරතුරු ලබා ගත් දිනය: 2021 ජූලි 02, Merriam-Webster වෙබ් අඩවියhttps://www.merriam-webster.com/dictionary/caregiver.

[13]කොලාන්ස් ශබ්ද කෝෂය (n.d.) Daycare Centre යන්නෙහි අර්ථය. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021ජූලි 02,https://www.collinsdictionary.com/dictionary/english/daycare-centre

තත්ත්වයක් (දුර්වලතාවයක්) සහිත ළමයින් වේ[14]. ආබාධ සහිත ළමයින් යනු පුළුල් පරාසයක අවශ්‍යතා ඇති විවිධත්වයෙන් යුතු ළමයින් කාණ්ඩයකි. සමහර ආබාධ සැඟවී තිබෙන හෝ දැකීමට පහසු නොවන ඒවා විය හැක.

**සාධාරණ හා වියදම් දැරිය හැකි ළමා රැකවරණය යන්නෙන්** සමාජ සාධාරණත්වය යන්න ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, භාෂාව, ආබාධිතභාවය හෝ පවුල් පසුබිම වැනි පුද්ගලික හෝ සමාජ-ආර්ථික තත්ත්වයන් ළමා රැකවරණ සේවාවන්හි ප්‍රතිලාභ නෙළා ගැනීමට බාධාවන් නොවන තත්ත්වයක් ලෙස නිර්වචනය කරනු ලැබේ[15]. දැරිය හැකි මිලකට යන්නෙන් එම සේවාවන් මිල අධික නොවන බව අදහස් කෙරෙයි. ළමා දිවා සුරැකුම් සේවා සඳහා ප්‍රවේශය සාධාරණ මෙන්ම දැරිය හැකි මිලකට ලබා ගත හැකි විය යුතුය.

**අන්තර්කරණය වූ පරිචයන්** මගින් ළමයින්ගේ විවිධත්වය පිළිගැනීමට ලක් කරන අතර, එය ඔවුන්ට ඉගෙනීමේ කටයුතු සඳහා පූර්ණ ලෙස සහභාගී වීමට අවස්ථාව උදාකර දේ. අන්තර්කරණය වූ පරිචය මගින් ළමයින්ගේ විවිධත්වය ඉගෙනීමේ අත්දැකීම වැඩි දියුණු කරන සම්පතක් ලෙස අගය කරයි[16]. ඉගැන්වීම සඳහා වන අන්තර්කරණය වූ ප්‍රවේශය යන්නෙන් සියලුම සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා හඳුනා ගැනීම, ඒවාට ඉඩ සැලසීම හා ඒවා ඉටු කිරීම අදහස් කරයි. එමෙන්ම සිසුන්ට විවිධ වූ පුද්ගලික ඉගෙනුම් අවශ්‍යතා ඇති බව හා ඔවුන් විවිධ වූ ප්‍රජාවන්හි සාමාජිකයින් බව පිළිගැනීම, හා ශිෂ්‍යයින් ඉගෙනීම සඳහා ස්ථාවරව පුරෝකථනය කළහැකි සහ ස්ථාවර ප්‍රවේශයන් සහිත නිශ්චිත කණ්ඩායම්වලට අයත් සිසුන් ලෙස ඒකාකෘතිකරණය කිරීම වැළැක්වීමත් අදහස් කෙරෙයි[17].

**ළමා රැකවරණයෙහි ගුණාත්මකභාවය** යන්නෙන් විශිෂ්ටත්වයේ මට්ටමක් අර්ථ දැක්වෙන අතර එයින් සාමාන්‍යය මට්ටමක් අදහස් නොකරයි. එහිදී තමන් තෝරා ගන්නා ළමා රැකවරණ සේවා සපයන්නා විසින් තමන්ගේ ළමයා මානසිකව හා ශාරීරිකව දියුණු වන සුරක්ෂිත හා ප්‍රබෝධමත් ආදරණීය පරිසරයක් සපයා දෙන්නේ ය යන්න දෙමාපියන්ට හැඟී යාම අත්‍යවශ්‍ය වේ[18].

**ප්‍රතිචාරී රැකවරණයක් සපයා දීම යන්න** මගින් සෑම දරුවෙකුට ම අනන්‍ය අවශ්‍යතා සහ මනාපයන් ඇති බවත්, විශ්වාසවන්ත වැඩිහිටියන් සහ ළමයින් අතර සිදුවන සමාජීය අන්තර් ක්‍රියාකාරකම් තුළින් කුඩා ළමයින් වඩාත්ම හොඳින් ඉගෙන ගන්නා බවත් පිළිගනියි. ඉගැන්වීමේ ක්‍රියාවලිය හා දෙමාපියභාවයේ පුහුණුව මගින් ළමයින්ගේ සමාජ හා චිත්තවේගීමය සෞඛ්‍යය ප්‍රවර්ධනය කරයි. එයට ළමයාගේ ඉඟිවලට (ඇස්වල බැල්ම, ඉරියව්, මුහුණේ ඉරියව්, ශබ්ද කිරීම් ආදියට) සංවේදී වීම, ළමයා සන්නිවේදනය කිරීමට උත්සාහ කරන දේ පිළිබඳව සිතීම, සංවේදී ආකාරයකට ළමයාට ප්‍රතිචාර දැක්වීම ද එයට ඇතුළත් වේ[19].

---

[14]ආබාධිතභාවය සහ සෞඛ්‍යය පිළිබඳ දළ විශ්ලේෂණය. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 24https://www.cdc.gov/ncbddd/disabilityandhealth/disability.html

[15]ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානය (2008), ප්‍රතිපත්ති සංක්ෂිප්තය: අධ්‍යාපනයේ සාධාරණත්වය සඳහා පියවර දහයක්. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021ජූනි10 https://www.oecd.org/education/school/39989494.pdf

[16]සමානාත්මතා අභියෝග ඒකකය (2013) ශාස්ත්‍රඥයින් සඳහා සමානාත්මතාවය සහ විවිධත්වය: අන්තර්කරණ පිළිවෙත. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 12 https://www.ecu.ac.uk/wp-content/uploads/external/e-and-d-for-academics-factsheet-inclusive-practice.pdf

[17]තස්මේනියා විශ්වවිද්‍යාලය (2018). ඉගැන්වීම සහ ඉගෙනීම: අන්තර්කරණ පිළිවෙත්. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 13https://www.teaching-learning.utas.edu.au/unit-design/inclusive-practices

[18]කැලිෆෝනියා අධ්‍යාපන දෙපාර්තමේන්තුව (n.d.) ගුණාත්මක ළමා රැකවරණය අර්ථ දැක්වීම, තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූනි 20 https://www.cde.ca.gov/sp/cd/re/caqdefinecare.asp

[19]රකාස්, එල්. (2019) ප්‍රතිචාරී ළමා රැකවරණය යනු කුමක්ද. තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 මැයි 11, https://info.childcareaware.org/blog/responsive-caregiving

Final Draft-NCPA

## 2.3.ප්‍රතිපත්තියේ මගපෙන්වීමේ මූලධර්ම

ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට පහත සඳහන් මූලධර්මවලින් මඟ පෙන්වනු ලැබේ:

1. **සියලුම ළමයින්ට පැවැත්ම හා සංවර්ධනය සඳහා අයිතිය ඇත.**
2. **ළමයින් සම්බන්ධ සියලුම ක්‍රියාවන්හි මූලික අවධානය ලෙස ළමයාගේ හෝ ළමයින් කණ්ඩායමේ උපරිම යහපත සැලකිල්ලට ගත යුතුය.** අන් අයගේ යහපත (දෙමව්පියන්ගේ, ප්‍රජාවේ, රාජ්‍යයේ) අධිගාමී සැලකිලිමත් වීම නොවිය යුතුය[20].
3. **දිවා රැකවරණයෙහි සිටින සෑම ළමයෙකුටම සුරක්ෂිත, ආරක්ෂිත හා ළමයින්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාරී පරිසරයක් තුළ දියුණු වීමට අවස්ථාව තිබිය යුතුය.** එමගින් දෙමාපියන්ට තම ළමයින් ආරක්ෂිතව සිටින්නේය යන හැඟීම ඇති කරවන අතර, එය රැකියාවල නියුතු දෙමාපියන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීමට දායක වනු ඇත.
4. **රැකවරණය සපයන්නන් මනා පුහුණුව ලැබූ, විශ්වාසවන්ත, සහ නිවැරදි ආකල්ප හා කුසලතා සහිත, ළමයින්ගේ විවිධ අවශ්‍යතාවයන්ට යෝග්‍ය පරිදි ප්‍රතිචාර දක්වන පුද්ගලයින් විය යුතුය.** රැකවරණය සපයන්නන්ට ළමයින්ගේ වර්ධනය හා සංවර්ධනය, ඔවුන් ඉගෙන ගන්නා ආකාර සහ ඔවුන්ගේ අනන්‍ය ලක්ෂණ පිළිබඳ දැනුම තිබීම අත්‍යාවශ්‍ය වේ.
5. **ළමයින්ගේ සංවර්ධනාත්මක අවශ්‍යතාවලට, ඔවුන්ගේ අදහස්වලට, අනන්‍ය ලක්ෂණවලට සහ පවුල්වල සංස්කෘතීන්ට ගරු කිරීම ඔවුන්ගේ නිරෝගී සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ.** රැකවරණය සපයන්නන් ළමයින්ට ගරු කළ යුතු අතර, ඕනෑම ආකාරයක වෙනස්කොට සැලකීම්වලින් ඔවුන්ව ආරක්ෂා කළ යුතුය. පෙනුම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, ආගම, සමාජ තත්ත්වය හෝ ආබාධිතභාවය මත පදනම්ව කිසිදු ළමයෙකුට වෙනස්කම් නොකළ යුතුය.
6. **රැකවරණය සලසන්නා සහ ළමයාගේ දෙමාපියන්/ භාරකරුවන්/ පවුල අතර සම්බන්ධතාවය ළමයාගේ යහපැවැත්ම සඳහා අතිශය වැදගත් වේ.** දෙමව්පියන් සහ රැකවරණය සලන්නන් අතර සම්බන්ධතාවය ගෞරවය සහ සාධනීය ප්‍රවේශයකින් සංලක්ෂිතවන විට, ළමයින් එම පරිසරය සහ ඉගෙනීම කෙරෙහි වඩාත් ධනාත්මක ආකල්පයක් ඇති කර ගනී [21].
7. **ක්‍රීඩාව සහ විවේකය ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පරිසරයන් තුළ ඉතා වැදගත් අවශ්‍යතාවයකි.** ළමයින් ක්‍රීඩාව හරහා බොහෝ දේ ඉගෙන ගනී. ඔවුහු මිතුරන් ඇති කර ගැනීමට, සහයෝගයෙන් කටයුතු කිරීමට, තීරණ ගැනීමට සහ ජයග්‍රහණය සහ පරාජය යන දෙකම අත්විඳීමට ඉගෙන ගනිති. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 31 වැනි වගන්තිය මගින් සෑම ළමයෙකුටම වෙහෙස නිවා ගැනීමට, විවේක ගැනීමට, ක්‍රීඩා කිරීමට, විනෝදාත්මක ක්‍රියාකාරකම්වල යෙදීමට සහ සංස්කෘතික හා කලාත්මක ජීවිතයක් සඳහා නිදහසේ හා පූර්ණ ලෙස සහභාගීවීමට ඇති අයිතිය පිළිගනියි.
8. **ආබාධ සහිත ළමයින් අත්හැර නොදැමිය යුතුය.** හැකි සෑම අවස්ථාවකදී ම අන්තර්කරණය ප්‍රවර්ධනය කළයුතු අතර, ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම පිණිස ඔවුන් සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති ළමා රැකවරණ සේවා සපයා දිය යුතුය.

## 2.4. ප්‍රතිපත්තියෙහි දැක්ම සහ මෙහෙවර

[20] ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989),6 වැනි සහ 3 වැනි වගන්ති,තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 මැයි 30, https://www.ohchr.org/en/professionalinterest/pages/crc.aspx

[21] බාර්නාඩෝස් ජාතික ළමා සම්පත් මධ්‍යස්ථානය (2006), දෙමව්පියන් සම්බන්ධවීම: ළමා රැකවරණ සේවා සපයන්නන් සඳහා අත්පොතක්. තොරතුරු ලබා ගත් වෙබ් අඩවිය: https://www.barnardos.ie/media/1495/parental_involvement.pdf

Final Draft-NCPA

දැක්ම

ළමයින්ගේ, දෙමව්පියන්ගේ/භාරකරුවන්ගේ සහ පවුල්වල අවශ්‍යතා සපුරාලන, සුරක්ෂිත, ආදරණීය හා පෝෂණය කරවන පරිසරයක් තුළ ළමයින්ට ඔවුන්ගේ පූර්ණ විභවය වෙත ළඟා වීම සඳහා අවස්ථා ඇති, සමාජ සාධාරණ හා මිල දැරිය හැකි උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් සේවාවන් ස්ථාපිත කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ඇති සියලුම ළමා දිවා සුරැකුම් පහසුකම් -

- ප්‍රමිතීන්ට සහ නියමයන්ට අනුකූල වන බව;
- සුරක්ෂිත, මිල දැරිය හැකි, උසස් තත්ත්වයේ රැකවරණයක් සපයා දීමේ දී දෙමව්පියන්ට, විශේෂයෙන් ම රැකියාවල නියුතු දෙමව්පියන්ට, වටිනා සේවාවක් සපයා දීම;
- දෙමව්පියන්ට/භාරකරුවන්ට තම දරුවන්ගේ ප්‍රගතියෙහි පූර්ණ හවුල්කරුවන් වීමට හැකි වන පරිදි මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්වලට දෙමව්පියන් සම්බන්ධ කර ගැනීම; සහ
- ළමයින්ට වගකිව යුතු පුරවැසියන් බවට පත්විය හැකි වන පරිදි ළමයින්ගේ ශාරීරික යහපැවැත්ම, සමාජ, චිත්තවේගීය සහ ප්‍රජානන සංවර්ධනය සඳහා සහාය වීම;

සහතික කිරීම.

## 2.5.ප්‍රතිපත්තියේ ඉලක්ක සහ අරමුණු

සුරක්ෂිත, දයාන්විත පරිසරයන් තුළ ළමයින්ගේ සාකල්‍ය සංවර්ධනයට සහාය වන සහ රැකියාවල නියුතු දෙමාපියන්ට/පවුල්වලට තම ළමයින් සුරක්ෂිතව සිටින්නේය යන හැඟීම ලබා දෙන, සමාජ සාධාරණ හා මිල දැරිය හැකි උසස් තත්ත්වයේ රැකවරණයක් සපයා දීම පිණිස ළමා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඒවා නියාමනය කිරීම මෙම ප්‍රතිපත්තියෙහි ඉලක්කය වේ.

මෙම ප්‍රතිපත්තියෙහි නිශ්චිත අරමුණු පහත සඳහන් පරිදි වේ:

1. රැකියාවල නියුතු දෙමාපියන්ගේ/පවුල් වල ළමයින් සඳහා මිල දැරිය හැකි ළමා දිවා සුරැකුම් පහසුකම්වලට සාධාරණ ප්‍රවේශය පුළුල් කිරීම.
2. ළමයින් තමන්ගේ උපරිම විභවය වෙත ළඟාවන බව සහතික කිරීම සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් සේවා සැපයීම සඳහා පහසුකම් සැලසීම.
3. ආබාධ සහිත ළමයින් සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම.
4. ළමා දිවා රැකවරණ පහසුකම් කළමනාකරණයේ ඵලදායිතාව ඉහළ නැංවීම.
5. කාර්යක්ෂම පාලනය සහ වගවීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ කාර්යරාමුවක් හඳුන්වා දීම.

## 2.6. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

1 වෙනි ක්ෂේත්‍රය: සපයා දෙනු ලබන රැකවරණයෙහි ගුණාත්මකභාවය

**1.1 වෙනි ප්‍රතිපත්තිය: සෑම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම ඇති භෞතික පරිසරය ආරක්ෂිත, ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත, අවශ්‍ය උපකරණවලින් සමන්විත සහ සියලු ළමයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා උචිතවන බව සහතික කර ගැනීම.**

1. ළමා දිවා සුරැකුම් පහසුකම්වල භෞතික පරිසරය පිළිබඳ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නියම කර ඇති ජාතික මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වගකිව යුතු ආයතන ශක්තිමත් කිරීම.
2. අවශ්‍ය ඉඩකඩ, ලී බඩු, ඉගෙනුම් ද්‍රව්‍ය සහ ක්‍රීඩා උපකරණ සහිතව භෞතික පරිසරය වැඩි දියුණු කිරීම සඳහා සුදුසුකම්ලත් ළමා දිවා සුරැකුම් සේවා සපයන්නන්ට සහන ණය යෝජනා ක්‍රම සහ වෙනත් මූල්‍ය ආධාර ක්‍රම හඳුන්වා දීම.
3. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නියම කර ඇති ජාතික මාර්ගෝපදේශවලට අනුකූලවන භෞතික පරිසරයන් සහිත නව මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා මූල්‍ය හෝ ද්‍රව්‍යමය ආධාර සපයා දීම.
4. ළමා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන පරිදි භෞතික පරිසරය වැඩි දියුණු කිරීම සඳහා සුදුසු මග පෙන්වීම් සහ මූල්‍ය සහාය සපයා දීම තුළින් ඉලක්ක ගත ප්‍රදේශවල ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා පහසුකම් සැලසීම.
5. සුභසාධන සේවාවක් ලෙස පවත්වාගෙන යනු ලබන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන තුළ භෞතික පරිසරයන් වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය සහ දානපතියන් තුළ උනන්දුවක් ඇති කිරීම ප්‍රවර්ධය කිරීම.
6. පෙර පාසල සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පරිශ්‍රයෙන් ලබා දී ඇති ඉඩකඩ වෙනම ම තිබෙන සේ වෙන් කිරීම සඳහා එම මධ්‍යස්ථානවලට පහසුකම් සැලසීම.
7. ළමයින්ගේ සංවර්ධනය කෙරෙහි භෞතික පරිසරයෙන් ඇති කෙරෙන බලපෑම පිළිබඳව දෙමාපියන්ගේ/ භාරකරුවන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.

**1.2 වෙනි ප්‍රතිපත්තිය: සෑම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්ම යහපත් සෞඛ්‍යය හා පෝෂණය සඳහා ළමයින්ට ඇති අයිතිය ප්‍රවර්ධනය කරන බව සහතික කිරීම.**

1. සෞඛ්‍ය සම්පන්න ආහාර පාන, ආහාර ගැනීම සඳහා තිබිය යුතු පරිසරය සහ ක්‍රීඩා පරිසරය පිළිබඳ රැකවරණය සපයන්නන් සඳහා මාර්ගෝපදේශ සපයා දීම.
2. රැකවරණය සපයන්නන් විසින් නිරන්තරවම ළමයින්ගේ ශාරීරික හා චිත්තවේගී අවශ්‍යතා අධීක්ෂණය කරනු ලබන බව සහතික කර ගැනීම.
3. යහපත් සෞඛ්‍යය සහ පෝෂණය කෙරෙහි ළමයින්ගේ උනන්දුව ප්‍රවර්ධය කිරීම සඳහා මධ්‍යස්ථානයේ ළමා පරිසරය සැලසුම් කිරීමට රැකවරණය සපයන්නන්ට පහසුකම් සැලසීම.
4. සෞඛ්‍යය, ශාරීරික ක්‍රියාකාරකම් සහ පෝෂණය පිළිබඳව දෙමාපියන්/ භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.
5. ළමයින්ගේ සෞඛ්‍යය හා පෝෂණය ප්‍රවර්ධය කිරීම සඳහා ප්‍රජාවෙහි සහ ඉදිරි පෙළ සෞඛ්‍ය රැකවරණ නිලධාරීන්ගේ සේවාවන් ප්‍රයෝජනයට ගැනීම දිරිමත් කිරීම.
6. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්හි සිටින ළමයින්ට ගුණාත්මක සෞඛ්‍ය, දන්ත හා ළමා සංවර්ධන පරීක්ෂණ සහ පරිපූර්ණ පසු විපරම් සඳහා ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම.

**1.3 වෙනි ප්‍රතිපත්තිය: සෑම රැකවරණය සලසන්නෙකු ම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේදී ඵලදායී, ප්‍රතිචාරී රැකවරණයක් සපයා දෙන බව සහතික කිරීම.**

Final Draft- NCPA

**උපාය මාර්ග**

1. ළමයාගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීමට, අවධානය යොමු කිරීමට, ළමයාට උපකාර කිරීමට, ළමයාගේ ගවේෂණය කිරීමට සහාය දීමට සහ ළමයාගේ සංවර්ධනයට රුකුල් දීම පිණිස ළමයාගේ උවමනා සහ අවශ්‍යතා හඳුනා ගැනීමට රැක බලාගන්නන් සතුව ඇති හැකියාව ශක්තිමත් කිරීම.
2. දෙමව්පියන්ට/ භාරකරුවන්ට ළමයින්ගේ අවශ්‍යතා හා මනාපයන් හඳුනාගෙන ඔවුන්ගේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි ප්‍රතිචාරී රැකවරණය සැලසීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට පහසුකම් සැලසීම.
3. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පරිසරය තුළ ප්‍රතිචාරී රැකවරණය සැලසීමේ පරිචයන් සඳහා පහසුකම් සැලසීම පිණිස රැකවරණය සපයන්නන්ට සම්පත් හඳුන්වා දීම හා මඟ පෙන්වීම ලබා දීම.
4. සෑම ළමයෙකුටම තමන් අයත්ව සිටින්නේය යන හැඟීමක් සහ තමන් ගැන ධනාත්මක හැඟීමක් ඇතිවන බව සහතික කෙරෙන පරිචයන් සඳහා පහසුකම් සැලසීම.

## 1.4 වෙනි ප්‍රතිපත්තිය: සෑම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්ම ළමයින්ට ඉගෙන ගැනීම සහ සංවර්ධනය වීම සඳහා අවස්ථාව සපයා දෙන බව සහතික කිරීම.

**උපාය මාර්ග**

1. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ළමයින්ට ගවේෂණය කිරීමට සහ සොයා ගැනීමට ඉඩ සලසන අධ්‍යාපනික ද්‍රව්‍ය හා උපකරණ වැනි වයසට ගැළපෙන සම්පත් වලින් සමන්විත වීම සඳහා පහසුකම් සලසා දීම.
2. ළමයින්ගේ භාෂා හැකියාව දියුණු කිරීමට උපකාර කිරීම සඳහා සාක්ෂරතා මධ්‍යස්ථානයක්/ පුස්තකාලයක් ස්ථාපනය කිරීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා පහසුකම් සලසා දීම. මෙම සම්පත් සපයා ගැනීම සඳහා පවුල්වල සහ ප්‍රජාවගේ සහයෝගය ලබා ගත හැක.
3. ඉගෙනීමේ අවස්ථා ඇති කිරීමට පහසුකම් සැලසීමේ දෛනික පුරුද්දක් අනුගත කර ගැනීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට අවශ්‍ය මඟ පෙන්වීම සපයා දීම. මෙය වැඩිහිටි ළමයින්ට ඔවුන්ගේ විධිමත් අධ්‍යාපන කටයුතුවල නියැලීමට උපකාරී වනු ඇත.
4. ළමයින්ගේ ඉගෙනීම වැඩි දියුණු කරන, වයසට ගැළපෙන ක්‍රීඩා අවස්ථා සපයා දීමට රැකවරණය සපයන්නන්ට මඟ පෙන්වීම.
5. ළමයින්ගේ ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා ඕනෑම වැඩිහිටියෙකුට භාවිතා කළ හැකි ඉගෙනුම් ද්‍රව්‍ය නිපදවීම සඳහා පහසුකම් සැලසීම.
6. ළමයින්ට හිතකර හා සුවපහසු, ආබාධ සහිත හෝ ආබාධිත යැයි සැක කරනු ලබන ළමයින් ද ඇතුළුව සෑම දෙනාටම සහභාගී වීමට අවස්ථාව ලැබෙන ඉගෙනුම් අවකාශයන් සපයා දීමට පහසුකම් සැලසීම.
7. රැකවරණය සපයන්නන් ළමයින්ගේ ඉගෙනීමට උපකාරී විය හැකි තොරතුරු දෙමාපියන්/ භාරකරුවන් සමඟ හුවමාරු කර ගන්නා බවට සහතික කර ගැනීම.

Final Draft - NCPA

**1.5 වෙනි ප්‍රතිපත්තිය: ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සිටින සෑම ළමයෙකුම අපයෝජනවලින් හා වෙනත් පාරිසරික අනතුරුවලින් ආරක්ෂා කර ඇති බව සහ තමන් සුරක්ෂිත සහ ආරක්ෂිතව සිටින්නේ යැයි ඔවුන්ට හැඟෙන බව සහතික කිරීම.**

**උපාය මාර්ග**

1. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සේවය කිරීම සඳහා බඳවා ගනු ලබන සියලුම කාර්ය මණ්ඩලය විශ්වාසවන්ත හා යහපත් චරිතයක් ඇති අය වන බව ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ වගකිව යුතු පළාත් ආයතන විසින් සහතික කළ යුතුය. ඔවුහු ළමයාගේ උපරිම යහපත පිණිස ක්‍රියා කරති. ළමයින්ව වෙනස්කොට සැලකීම් වලින්, හිරිහැර කිරීම්වලින් සහ වෙනත් පාරිසරික අනතුරු වලින් ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීමට රැකවරණය සපයන්නන්ට හැකියාව තිබිය යුතුය.
2. ළමයින් සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම රැකවරණය සපයන්නන් සහ අනෙකුත් පුද්ගලයින් සඳහා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම.
3. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සිටින සියලුම ළමයින් සියලු ආකාරවල අපයෝජනවලින් හා හිංසනවලින් ආරක්ෂා කර ඇති බවට සහතික කර ගැනීම සඳහා යාන්ත්‍රණ හඳුන්වා දීම. එවැනි තත්ත්වයන් හඳුනා ගැනීමටත්, රැකවරණය සහ රහස්‍යභාවය සහතික කරමින් යොමු කිරීම් සිදු කිරීමටත්, වාර්තා කිරීමේ මාර්ග පිළිබඳව ළමයින්, දෙමව්පියන්/ භාරකරුවන් සහ පවුල් දැනුවත් කිරීමටත් රැකවරණය සපයන්නන්ව පුහුණු කළ යුතුය.
4. පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් විවිධ අවස්ථාවලදී ආරක්ෂිතව සිටීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ළමයින්ව සවිබල ගැන්වීමට රැකවරණය සපයන්නන්ට පහසුකම් සැලසීම.
5. ළමා අපයෝජන සහ අනෙකුත් පාරිසරික අනතුරු පිළිබඳව සුදුසු පියවර ගැනීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වගකිව යුතු පළාත් ආයතන ශක්තිමත් කිරීම.

**1.6 වෙනි ප්‍රතිපත්තිය:සෑම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම සේවය කරන රැකවරණය සපයන්නන් වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් අය බව සහතික කිරීම.**

1. ජාතික මාර්ගෝපදේශවල දක්වා ඇති, ළමා රැකවරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම රැකවරණය සලසන්නෙකුට ම මගපෙන්වීම.
2. රැකවරණය සපයන්නන්ට රැකවරණය සැලසීමේ පරිචයන් පිළිබඳ නවතම දැනුම ලබා ගැනීමට උපකාරීවන හැකියා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට පහසුකම් සැලසීම.
3. ළමයින්ව ශාරීරික උපද්‍රවවලින්, චිත්තවේගීය ආතතියෙන් සහ පාරිසරික අවදානම්වලින් ආරක්ෂා කිරීම සඳහා රැකවරණය සපයන්නන් සතු හැකියාව සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සහ එය ශක්තිමත් කිරීම.
4. රැකවරණය සපයන්නන්ට ළමා සංවර්ධනය, ඉගෙනීම සහ ළමා ආරක්ෂාව පිළිබඳව ඔවුන් සතු දැනුම හා කුසලතා යාවත්කාලීන කර ගැනීම සඳහා උපකාර කිරීම පිණිස අත්පොත් සහ අනෙකුත් ද්‍රව්‍ය වැනි සම්පත් සපයා දීමට මගපෙන්වීම.
5. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ක්‍රියාකාරකම්වලට පවුල් යෝග්‍ය පරිදි සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කුසලතා අත්කර ගැනීමට සහ පවුල්වලට හා කාර්ය මණ්ඩලයට එකිනෙකාගෙන් ඉගෙන ගත හැකි පරිසරයක් නිර්මාණය කිරීමට රැකවරණය සපයන්නන්ට සහය වීම.
6. හදිසි අවස්ථාවකට පෙර, හදිසි අවස්ථාවක් අතරතුර හා ඉන් පසුව ළමා දිවා සුරැකුම් සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා රැකවරණය සපයන්නන්ගේ හදිසි අවස්ථා පෙර සූදානම සඳහා පහසුකම් සැලසීම.

Final Draft- NCPA

7. රැකවරණය සපයන්නන්ගේ දැනුම, ආකල්ප සහ පිළිවෙත් මැන බැලීම සඳහා වලංගු ඇගයීම් නිර්ණායක හඳුන්වා දීම.
8. ළමයින්ගේ සංවර්ධන ආබාධ හෝ සංවර්ධන ප්‍රමාදයන් හඳුනා ගැනීම සහ ඒවා මෙහෙයවා ගැනීම සඳහා රැකවරණය සපයන්නන් සතු ධාරිතා සංවර්ධය කිරීමට පහසුකම් සැලසීම.

2 වෙනි ක්ෂේත්‍රය: වියදම් දැරිය හැකි ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා සමාජ සාධාරණ ප්‍රවේශය

## 2.1 වෙනි ප්‍රතිපත්තිය: ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා සමාජ සාධාරණ සහ මිල දැරිය හැකි ප්‍රවේශයක් සහතික කිරීම.

උපාය මාර්ග

1. රජයේ ආයතනවලට ඒවායෙහි සේවක පිරිස සඳහා ආයතන පරිශ්‍රය තුළ දැරිය හැකි මිලකට ළමා දිවා සුරැකුම් පහසුකම් සපයා දීමට පහසුකම් සැලසීම. මේ සඳහා උපකාරී වනු පිණිස ළමා රැකවරණ සංවර්ධන අරමුදලක් පිහිටුවිය හැකිය.
2. රාජ්‍ය නොවන සේවා යෝජකයන්ට බදු ණය වැනි දිරි ගැන්වීම් ලබා දීම මගින් තම සේවා ස්ථානවල ළමා දිවා සුරැකුම් පහසුකම් සපයා දීමට පහසුකම් සැලසීම.
3. පවුල් පාදක, ප්‍රජා පාදක සහ රාජ්‍ය නොවන සංවිධාන පාදක වැනි විවිධ වාතාවරණයන් තුළ මිල දැරිය හැකි ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියක් සැලසුම් කිරීම.
4. ගුණාත්මක ළමා රැකවරණය සඳහා දැරීමට සිදුවන පිරිවැය පියවා ගැනීම පිණිස දෙමව්පියන්ට/භාරකරුවන්ට සහාය වීම සඳහා එක් එක් ළමයා පදනමින් ළමා දිවා රැකවරණ සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම, (සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවලින් උපකාර ලබන හෝ ලැබීමට සුදුසුකම් ඇති පවුල්වලට සහ ආබාධ සහිත ළමයින්ට ප්‍රමුඛත්වය ලබා දිය හැක) හෝ තමන්ගේ ළමයින් සඳහා ළමා දිවා සුරැකුම් සේවා අවශ්‍ය කරන සියලුම පවුල්වලට ඍජු මූල්‍ය සහන සලසා දෙන පොදු ළමා ප්‍රතිලාභ වැඩසටහනක් ලෙස සමාජ ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
5. ඉලක්කගත ප්‍රදේශවල (අඩු පහසුකම් සහිත, පහසුකම් නොමැති සහ අවාසි සහගත තත්ත්වයන් සහිත ප්‍රදේශවල) සුදුසුකම්ලත් පවුල් සඳහා මිල දැරිය හැකි ළමා දිවා සුරැකුම් පහසුකම් සැලසුම් කිරීම සඳහා පළාත් රජයයන්ට පහසුකම් සැලසීම. විකල්ප රැකවරණ ප්‍රතිපත්තියෙහි (14 වන පිටුවෙහි) යෝජනා කර ඇති පරිදි, සමාජ උපකාරක සේවාවක් වශයෙන් අවම මිලකට සහනදායි ළමා දිවා සුරැකුම් සේවා සපයා දිය හැකිය.
6. සමූපකාර පදනමක් මත ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා සුදුසුකම් සහිත රැකවරණය සපයන්නන්ට සහන ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

Final Draft - NCPA

7. සේවාවන්හි අඛණ්ඩ බව හා තිරසාර බව සහතික කිරීම පිණිස ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.
8. ආබාධ සහිත ළමයින් ඇතුළත් කර ගැනීම වැඩි කිරීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල අන්තර්කරණ පුරුදු ප්‍රවර්ධනය කිරීම. එවැනි සේවා සඳහා දිරි දීමනා ලබා දිය හැක.

## 3 වෙනි ක්ෂේත්‍රය: ආබාධ සහිත ළමයින් සඳහා රැකවරණය

**3.1 වෙනි ප්‍රතිපත්තිය: ආබාධ සහිත ළමයින් සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් පහසුකම් වෙත සමාජ සාධාරණ සහ වියදම් දැරිය හැකි ප්‍රවේශයක් සහතික කිරීම.**

**උපාය මාර්ග**

1. ආබාධ සහිත ළමයින් සඳහා දැරිය හැකි මිලකට, උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීමට/ප්‍රවර්ධය කිරීමට ජාතික හා පළාත් රාජ්‍ය ආයතනවලට පහසුකම් සැලසීම.
2. අන්තර්කරණය කිරීමෙහි ප්‍රතිලාභ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම හරහා සහ ආබාධ සහිත ළමයින්ව ඇතුළත් කර ගන්නා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට දිරි ගැන්වීම් ලබාදීම හරහා ආබාධ සහිත ළමයින් අන්තර්කරණය කර ගැනීම ප්‍රවර්ධය කිරීම.
3. ආබාධ සහිත ළමයින් සඳහා ළමා රැකවරණ සහාය සපයා දෙන ආයතන / පුද්ගලයින් සඳහා සහනාධාර, බදු අඩු කිරීම, සහන ණය යෝජනා ක්‍රම ආදිය හරහා මූල්‍ය සහාය සපයා දීම.
4. ආබාධ සහිත ළමයින්ට රැකවරණය සපයා දෙන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට සුදුසු සම්පත් සපයා දීමට පහසුකම් සැලසීම සහ එවැනි මධ්‍යස්ථානවල සේවය කරන රැකවරණය සපයන්නන්ගේ දැනුම හා නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව සපයා දීම.
5. ආබාධ සහිත ළමයින්ට රැකවරණය සපයා දෙන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා අරමුදලක් පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම, හෝ එවැනි මධ්‍යස්ථාන වලට පහසුකම් සැලසීම සඳහා වැඩසටහනක් හඳුන්වා දීම.
6. පරීක්ෂණ, සෞඛ්‍ය පරීක්ෂා කිරීමේ සංචාර, රැකවරණය සපයන්නන්ගේ සංවර්ධනය වැනි කාර්යයන් සඳහා සෞඛ්‍ය, සමාජ සේවා, සහ ළමා සංවර්ධන වැනි රාජ්‍ය අංශයේ ආයතන ඇතුළත සහයෝගීත්වයෙන් යුතුව කටයුතු කිරීම සඳහා පහසුකම් සැලසීම.

## 4 වෙනි ක්ෂේත්‍රය: ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරණය

**4.1 වෙනි ප්‍රතිපත්තිය: කාර්යක්ෂම හා ඵලදායී ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරණයක් සහතික කිරීම.**

**උපාය මාර්ග**

1. සේවාලාභීන්ගේ තෘප්තිය වැදගත්වන බැවින්, දෙමාපියන්ට/ භාරකරුවන්ට සහ පවුල්වලට ළමා දිවා සුරැකුම් සේවා කළමනාකරණය පිළිබඳ ලිඛිත තොරතුරු සපයා දීම සඳහා ළමා දිවා සුරැකුම් සේවාවන්ට පහසුකම් සැලසීම.
2. ළමා දිවා සුරැකුම් පහසුකම් කළමනාකරණය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නියම කර ඇති ජාතික ළමා දිවා සුරැකුම් මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලබන බව සහතික කිරීම.
3. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කළමනාකරණ කටයුතු එම මධ්‍යස්ථාන වල රැකවරණය ලබන ළමයින්ගේ දෙමාපියන්/ භාරකරුවන් සහ පවුල් සමඟ සහයෝගයෙන් යුතුව සිදු කරනු ලබන බව සහතික කිරීම.
4. ජාතික ළමා දිවා සුරැකුම් මාර්ගෝපදේශවල නියම කර ඇති වාර්තා නිවැරදි හා කාලීන වන ලෙස නිරතුරුව යාවත්කාලීන කරනු ලබන බව සහතික කිරීම.
5. ළමා දිවා සුරැකුම් පහසුකම තුළ ප්‍රායෝගික සහ නම්‍යශීලී දෛනික සහ සති කාල සටහන් භාවිතා කිරීම සඳහා එම රැකවරණ පහසුකම්වල කළමනාකාරීත්වයට පහසුකම් සැලසීම.
6. අවදානම් අවම කර ඇති බව හා නිසි පරිදි කළමනාකරණය කරනු ලබන බව සහතික කිරීම සඳහා ළමා දිවා සුරැකුම් පහසුකම් කළමනාකාරීත්වයට පහසුකම් සැලසීම.

## 5 වෙනි ක්ෂේත්‍රය: නියාමනය සහ පාලනය

### 5.1 වෙනි ප්‍රතිපත්තිය: ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා ඵලදායි නියාමනයන් සහ වගකිව යුතු පාලනයක් සහතික කිරීම.

**උපාය මාර්ග**


1. මධ්‍යස්ථාන පාදක, සේවා ස්ථාන පාදක සහ නිවාස පාදක ළමා රැකවරණ පහසුකම්වල මූලික අංග නිර්වචනය කිරීම. එක් එක් වර්ගයේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ඵලදායි නියමයන් හඳුන්වා දීමට පහසුකම් සැලසීම.
2. ළමා රැකවරණය සම්බන්ධයෙන් වගකිව යුතු පළාත් ආයතනවල සේවක සංඛ්‍යාව වැඩිකිරීම සහ ඔවුන්ගේ වෘත්තීය සංවර්ධන සඳහා වැඩියෙන් ආයෝජනය කිරීම මගින් එම ආයතනවල ආයතනික හා පුද්ගලික ධාරිතා ශක්තිමත් කිරීම.
3. සෑම පළාතක ම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යාමට සහ තම පළාත තුළ ඒකාබද්ධ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට පහසුකම් සැලසීම.
4. සපයා දෙනු ලබන රැකවරණ සේවාවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ උපකරණ සකස් කිරීම.
5. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන නිතිපතා නියාමනය කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පහසුකම් සැලසීම.
6. ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ වැදගත් දර්ශක නිරීක්ෂණය කරන වර්තමාන තොරතුරු පද්ධතිය භාවිතා කිරීමට පහසුකම් සැලසීම.
7. රජයේ ඵලදායි අධීක්ෂණයට සහ නියාමනයන්ට යටත්ව, පෞද්ගලික අංශයේ සේවා සැපයීමේ කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම.

Final Draft - NCPA

8. ජාතික, ජාත්‍යන්තර, දේශීය රාජ්‍ය නොවන ආදී ආයතනවලින් උපදේශක සේවා සපයා දීම සඳහා පහසුකම් සැලසීම.

## 2.7 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය

ශ්‍රී ලංකා රජය කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය හරහා ළමා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රතිපත්ති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා සහ අනෙක් අතට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන වාර්තාකරණ ක්‍රමයක් අනුගමනය කිරීම සඳහා, අමාත්‍යාංශ මට්ටමෙන් මධ්‍යම රජය සමඟ පහළ මට්ටම් සම්බන්ධ කරන, පාලනයේ විවිධ මට්ටම්වල සම්බන්ධීකරණ කමිටු පිහිටුවිය යුතුය. මෙම කමිටු විසින් ප්‍රතිපත්තියේ අදාළ ක්ෂේත්‍රයන්හි දක්වා ඇති උපාය මාර්ගවලට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා ඒවාට පහසුකම් සැලසීම සිදුකළ යුතුය(රූප සටහන 2.1 මගින් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය ඉදිරිපත් කෙරේ).




**රූප සටහන 2.1 : ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය**

### 2.7.1. කමිටුවල සංයුතිය

- **ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව**

කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ජාතික සම්බන්ධීකරණ කමිටුව පත්කළ යුතු වේ. එම ජාතික සම්බන්ධීකරණ කමිටුව මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතු අතර, කමිටුව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන සංශෝධන සිදු කළ යුතුය. එමෙන්ම, ජාතික සම්බන්ධීකරණ කමිටුව අවශ්‍යතාවය අනුව, මෙම ප්‍රතිපත්තියෙහි දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අදාළ

ක්ෂේත්‍රයන්හි නිපුණත්වය සහිත ප්‍රවීණයින්ගෙන් සමන්විත තාක්ෂණික කමිටු පත් කිරීමේ බලය ද ජාතික සම්බන්ධීකරණ කමිටුවට ඇත. කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් පත්කරනු ලබන නිලධාරියෙකු විසින් එහි සභාපතීත්වය දැරිය යුතුය. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මෙම කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස කටයුතු කරන අතර, එය කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරිය යුතුය. මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය:

1. කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ එම ලේකම් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්. (සභාපති)
2. කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ලේකම්)
3. පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන්
4. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති හෝ නියෝජ්‍ය සභාපති
5. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ
6. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන අතිරේක ලේකම්වරයෙක්
7. මුදල් අමාත්‍යාංශයේ නියෝජිතවරයෙක්
8. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරියෙක්
9. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරියෙක්
10. පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරියෙක්
11. වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරියෙක්
12. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරියෙක්

කාන්තා හා ළමා කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජාතික සම්බන්ධීකරණ කමිටුවෙහි සාමාජිකයින් වසර තුනක (3) කාලයක් සඳහා පත් කරනු ලැබේ. එය වසරකට දෙවරක් රැස්විය යුතු අතර, රැස්වීමක ගණපූරණය සාමාජිකයින් සංඛ්‍යාවෙන් 50% ට වඩා වැඩි විය යුතුය.

- **ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ පළාත් සම්බන්ධීකරණ කමිටු**

එක් එක් පළාතේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති අධීක්ෂණ කමිටුව විසින් පළාත් මට්ටමෙන් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා පළාත් සම්බන්ධීකරණ කමිටු ලෙස ක්‍රියාත්මක වීම පිණිස අනු කමිටුවක් බැගින් පත්කළ යුතුය. එමෙන්ම, අවශ්‍යතාවය අනුව, මෙම ප්‍රතිපත්තියෙහි දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අදාළ ක්ෂේත්‍රයන්හි නිපුණත්වය සහිත ප්‍රවීණයින්ගෙන් සමන්විත තාක්ෂණික කමිටු පත් කිරීමේ බලය ද එම පළාත් සම්බන්ධීකරණ කමිටුවට ඇත. පළාතේ ප්‍රධාන ලේකම්වරයා හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් පත්කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියෙක් පළාත් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ යුතු වේ. අදාළ පළාතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස කටයුතු කළ යුතු අතර, කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම එම දෙපාර්තමේන්තුවට පැවරෙයි.

1. ප්‍රධාන ලේකම්වරයා හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් පත්කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියෙක් (සභාපති)
2. පළාත් කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ලේකම්)

Final Draft - NCPA

3. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ එම අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්
4. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්
5. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ එම අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්
6. පෙර පාසල් අධිකාරියේ අධ්‍යක්ෂවරයා
7. පොලිස් දෙපාර්තමේන්තුව නියෝජනය කරන විධායක ශ්‍රේණියේ උසස් නිලධාරියෙක්
8. වැවිලි මානව සංවර්ධන භාරයේ නියෝජිතයෙක් (අදාළ වන්නේ නම්)
9. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්
10. ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ නියෝජිතයෙක්
11. පළාත් ප්‍රධාන ලේකම් විසින් නම් කරනු ලබන ළමයින් සඳහා කටයුතු කරනු ලබන රාජ්‍ය නොවන සංවිධානයක නියෝජිතයෙක්.

පළාත් සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති අධීක්ෂණ කමිටුවේ නිර්දේශය මත වසර තුනක (3) කාලයක් සඳහා ප්‍රධාන ලේකම්වරයා විසින් පත්කරනු ලැබේ. මෙම කමිටුව වසරකට තුන් වරක් රැස්විය යුතු අතර, රැස්වීමක ගණපූරණය සම්පූර්ණ සාමාජිකයින් සංඛ්‍යාවෙන් 50% ට වඩා වැඩි විය යුතුය.

- **ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු**

ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ලෙස කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති අධීක්ෂණ කමිටුව විසින් අනු කමිටුවක් පත්කළ යුතුය. මෙම කමිටුවේ සභාපතිත්වය අදාළ දිස්ත්‍රික් ලේකම් විසින් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් පත්කරනු ලබන අතිරේක දිස්ත්‍රික් ලේකම් විසින් දැරිය යුතුය. පරිවාස හා ළමාරක්ෂක සේවා භාර දිස්ත්‍රික් නිලධාරියා / දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය යුතුය:

1. දිස්ත්‍රික් ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් පත්කරනු ලබන අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයෙක්
2. පරිවාස හා ළමාරක්ෂක සේවා භාර දිස්ත්‍රික් නිලධාරි/ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි (ලේකම්)
3. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්
4. පළාත් පෙර පාසල් අධිකාරි/ ඒකකවල අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්
5. කලාප අධ්‍යාපන කාර්යාලවල කලාප අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්
6. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක්
7. මුල් ළමාවිය සංවර්ධන නිලධාරි - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
8. දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරි ( මධ්‍යම රජය)
9. දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරි ( පළාත් සභාව)
10. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
11. උපදේශන නිලධාරි - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
12. වනිතා සංවර්ධන නිලධාරි - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
13. දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
14. දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

Final Draft- NCPA

15. ළමා රැකවරණ පහසුකම් පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නියෝජිතයෙක්.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති අධීක්ෂණ කමිටුවේ නිර්දේශය මත වසර තුනක (3) කාලයක් සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත්කරනු ලැබේ. මෙම කමිටුව මාස තුනකට වරක් රැස්විය යුතු අතර, රැස්වීමක ගණපූරණය සම්පූර්ණ සාමාජිකයින් සංඛ්‍යාවෙන් 50% ට වඩා වැඩි විය යුතුය.

- **ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු**

ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කොට්ඨාස මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ලෙස කටයුතු කිරීම පිණිස කොට්ඨාස ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති අධීක්ෂණ කමිටුව විසින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අනු කමිටුවක් බැගින් පත්කළ යුතුය. මෙම කමිටුවේ සභාපතීත්වය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් හෝ සහකාර ප්‍රදේශීය ලේකම් විසින් දැරිය යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අනුයුක්ත කර ඇති පරිවාස හා ළමාරක්ෂක සේවා නිලධාරී / ස්ථානභාර පරිවාස නිලධාරී මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළ යුතුය. කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු වේ:

1. ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් (සභාපති)
2. පරිවාස හා ළමාරක්ෂක සේවා නිලධාරී/ ස්ථාන භාර පරිවාස නිලධාරී (ලේකම්)
3. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරි විසින් පත්කරනු ලබන නිලධාරියෙක්
4. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
5. මුල් ළමාවිය සංවර්ධන සහකාර
6. සමාජ සේවා නිලධාරි
7. සමෘද්ධි මූලස්ථාන කළමනාකරු
8. ECCD/පෙර පාසල් අධ්‍යාපනය සඳහා පිහිටුවා ඇති අදාළ පළාත් ආයතනයට අනුයුක්ත නිලධාරියෙක්
9. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
10. උපදේශන නිලධාරි/ සහකාර
11. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි
12. වනිතා සංවර්ධන නිලධාරි
13. පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය නියෝජනය කරන පොලිස් නිලධාරියෙක්
14. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරුවන් නියෝජනය කරන සාමාජිකයින් දෙදෙනෙක්
15. දෙමාපියන්/පවුල් නියෝජනය කරන සාමාජිකයින් දෙදෙනෙක්

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්ති අධීක්ෂණ කමිටුවේ නිර්දේශය මත වසර තුනක (3) කාලයක් සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පත්කරනු ලැබේ. මෙම කමිටුව අවම වශයෙන් වසරකට දෙවරක් වත් රැස්විය යුතු අතර, රැස්වීමක ගණපූරණය සම්පූර්ණ සාමාජිකයින් සංඛ්‍යාවෙන් 50% ට වඩා වැඩි විය යුතුය.

## 2.8. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය හා සුපරීක්ෂණය

මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම ආකාරවල ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආවරණය වන පරිදි මනා ලෙස සකස් කළ නියාමන හා සුපරීක්ෂණ රාමුවක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසෙනු ඇත.

Final Draft- NCPA

රජය විසින් සපයනු ලබන ප්‍රමිතීන් හා මාර්ගෝපදේශවලට අනුකූලව සියලුම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම සහ ළමයින්ට හා දෙමව්පියන්ට/ පවුල්වලට ගුණාත්මක සේවාවක් ලබාදෙන බව සහතික කර ගැනීම පිණිස පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු විසින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහාය ඇතිව ඒවා සුපරීක්ෂණය කිරීම සිදු කෙරේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සියලුම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය නියාමනය කළ යුතුය. නියාමනයේ ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා මනා සම්බන්ධීකරණයෙන් යුතු නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

දත්ත රැස්කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු තුළ පරිපූර්ණ කාලීන තොරතුරු පද්ධතියක් ස්ථාපනය කළයුතු වේ. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඵලදායීව නියාමනය කිරීම සඳහා සහ පරිපාලන නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට ඒවායෙහි අනුකූලත්වය අධීක්ෂණය කිරීම සඳහා මෙවලම් සකස් කළ යුතුය. මෙම සියලු ආයතන ආබාධ සහිත ළමයින්ට ලබාදෙන ළමා දිවා සුරැකුම් සේවා ද ඇතුලුව සියලුම ළමා දිවා සුරැකුම් සේවාවල දත්ත සංචිතයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

සියලුම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රතිඵල මැනීම, අඩුපාඩු හඳුනා ගැනීම සහ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ඇගයීම් සිදුකළ යුතුය. ළමයින් සඳහා සපයා දෙනු ලබන ළමා දිවා සුරැකුම් සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අදාළ ආයතන විසින් කාර්යසාධනය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දී, ගුණාත්මක සේවා සපයන්නන්හට දිරිගැන්වීම් සිදුකළ යුතුය. මෙය ළමා දිවා සුරැකුම් සේවාවල ගුණාත්මකභාවය පිළිබඳව දෙමාපියන්/ භාරකරුවන් අතර දැනුවත්භාවය වැඩි කිරීමට හේතු වනු ඇත.

## 2.9. පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරයන් සහ වගකීම්

- **කාන්තා හා ළමා සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාන්තා කාර්යාංශය, ජාතික කාන්තා කමිටුව සහ මුල් ළමාවිය සංවර්ධනය සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය යන ආයතන වර්තමානයේ කාන්තා හා ළමා සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ආයතන වේ. සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා කාන්තාවන් දැනුමෙන් හා කුසලතාවයෙන් සවිබල ගැන්වීම, ළමයින් සියලු ආකාරයේ හිංසනයන්ගෙන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ යහපැවැත්ම සහතික කරන ක්‍රමවේද සපයා දීම සහ අධීක්ෂණය කිරීම, ළමා හිතකාමී පාසල් පරිසරයක් නිර්මාණය කිරීම සහ සැමට අධ්‍යාපනය සහතික කිරීම[22] මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති කර්තව්‍යයන් අතර වේ.

රැකවරණය අවශ්‍ය කරන ළමයින් සම්බන්ධයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වගකිව යුතු හෙයින්, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල රැකවරණය ලබන ළමයින් සඳහා අවශ්‍ය රැකවරණය සැපයීමේදී මෙම ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතුය. එය මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේදී අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය ඉටු කරන දෙපාර්තමේන්තුව විය යුතුය.

ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වන ළමයින්ට ආරක්ෂාව සහ ප්‍රතිකාර සපයා දීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ශ්‍රී ලංකා රජය වෙත උපදෙස් ලබා දෙයි. එසේ හෙයින්, ළමා දිවා සුරැකුම් පහසුකම් අවශ්‍ය කරන සියලුම ළමයින්ට එම ළමයින්ගේ, දෙමාපියන්ගේ සහ පවුල්වල අවශ්‍යතා සපුරාලන, සුරක්ෂිත,දයාබර, සංවර්ධනාත්මක හා මනා ආරක්ෂාව සහිත

Final Draft-NCPA

[22] http://www.childwomenmin.gov.lk/

පරිසරයක් සපයා දීමේ අරමුණ ඇතිව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇත. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ළමයින් සඳහා සුරක්ෂිත ද යන්න තහවුරු කිරීමේ දී ජාතික සම්බන්ධීකරණ කමිටුවෙහි සාමාජිකයෙක් ලෙස එයට කාර්යභාරයක් පැවරේ. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙහි තනි වගකීම වේ.

කාන්තා කාර්යාංශය කාන්තාවන්ගේ ආර්ථික හා සමාජ සවිබලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සිදු කරයි. ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කාර්යාංශය මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට දායක වෙමින්, රැකියාවල නියුතු කාන්තාවන්ට ගුණාත්මක ළමා රැකවරණ පහසුකම් සහතික කළ යුතුය.

- **සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය**

ශ්‍රී ලාංකික ළමයින්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වකරු වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය යි. 2012 වර්ෂයේ දී මෙම අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලද මාතෘ හා ළමා සෞඛ්‍යය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් ගැබ් ගැනීම, දරු ප්‍රසූතිය සහ පශ්චාත් ප්‍රසව කාලය යන අවස්ථාවල සිටින කාන්තාවන් සහ අලුත උපන් ළමයින්, ළදරුවන් සහ වයස අවුරුදු 18 දක්වා ළමයින් ආවරණය කරයි.[23] ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය යටතේ ඇති ඉහත සඳහන් කළ ආයතන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල රැකවරණය ලබන ළමයින්ගේ සෞඛ්‍යය, පෝෂණය සහ මනෝ සමාජීය සංවර්ධනය සම්බන්ධ කරුණුවලදී මෙන්ම දිවා සුරැකුම් පහසුකම් සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණුවලදී ද සෞඛ්‍ය අමාත්‍යාංශය සහ එහි පවුල් සෞඛ්‍ය කාර්යාංශය සමඟ සමීපව කටයුතු කළ යුතුය.

- **අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශය**

පාසල් කාලයෙන් පසු ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාලය ගත කරන, වයස අවුරුදු 12 දක්වා වූ ළමයින් මෙම ප්‍රතිපත්තිය මඟින් ආවරණය කෙරෙයි. එමෙන්ම, බොහෝ විට පෞද්ගලික පාසල් විසින් පවත්වාගෙන යනු ලබන, පාසල් කාලයෙන් පසුව ක්‍රියාත්මකවන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද තිබේ. පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සතුවන අධිකාරී බලය පිළිගෙන, මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

- **සමාජ සේවා දෙපාර්තමේන්තුව**

ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවට වැදගත් කාර්යභාරයක් පැවරී ඇත. ඉතාමත් ම අවදානමට ලක්විය හැකි සහ අවාසිදායක තත්ත්වයන්ට මුහුණ දී සිටින ළමයින් සඳහා රැකවරණ අවස්ථා සපයා දීමේදී ඉතාමත් වටිනා, දීප ව්‍යාප්ත ජාලයක් එම දෙපාර්තමේන්තුව සතුව තිබේ. ආබාධිතභාවය වැනි අවාසි සහගත තත්ත්වයන් යටතේ සිටින ළමයින් මෙම ප්‍රතිපත්තියෙහි ප්‍රමුඛතම ක්ෂේත්‍රවලින් එකක් වේ. ළමා රැකවරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් හා ක්‍රමෝපායන් අවශ්‍ය කරන බැවින්, ඉතාමත් අවදානම් සහගත සහ

Final Draft-NCPA

---

[23]මාතෘ සහ ළමා සෞඛ්‍යය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූලි 3, http://www.health.gov.lk/moh_final/english/public/elfinder/files/publications/publishpolicy/4_Maternal%20and%20Child%20Health.pdf

අවාසි සහගත තත්ත්වයන්හි සිටින ළමයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට මෙන්ම ආන්තික ප්‍රජාවන්ට ද ළමා දිවා සුරැකුම් පහසුකම් සපයා දීමේ දී කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ සමීප සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කළ යුතුය.

- **පළාත් සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ පෙර පාසල් කළමනාකරණය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් පළාත් සභාවලට බලය පැවරී ඇත. එම නිසා, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය සහ ඵලදායී කළමනාකරණය සහතික කරමින් සහ එම මධ්‍යස්ථානවල කාර්යයන් පිළිබඳ සමස්ත අධීක්ෂණය සිදු කරමින් එම මධ්‍යස්ථාන වෙත ප්‍රවේශය පුළුල් කිරීමේ වගකීම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වෙත පැවරී තිබේ. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල දී ඉගෙනීමට අවස්ථා සලසා දීම මෙම ප්‍රතිපත්තියෙහි වැදගත් අංගයක් වන හෙයින්, සහ ඇතැම් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහිතව ක්‍රියාත්මක වන හෙයින්, ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා පිහිටුවා ඇති පළාත් නියාමන ආයතන පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට සහාය විය යුතුය. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, විශේෂයෙන් ම පෙර පාසල් සහිතව ක්‍රියාත්මක වන දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පළාත් සභා විසින් අධීක්ෂණය කරනු ලැබ ඇති බව ඌව පළාතේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පළාත් ප්‍රඥප්තිය මගින් පෙන්නුම් කරයි. මෙම සන්දර්භය තුළ, මෙම ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා ජාතික මට්ටමෙන් කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය සමඟ සහ පළාත් මට්ටමෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සහයෝගයෙන් යුතුව කටයුතු කළ යුතු යැයි අපේක්ෂා කෙරේ.

- **වැවිලි මානව සංවර්ධන භාරය**

වැවිලි මානව සංවර්ධන භාරය ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන වතුවල ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එය එම වතුවල සේවකයින්ගේ ළමයින් සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරණය කරයි. මෙම ප්‍රජාවගේ ජීවිතය නගා සිටුවීම සඳහා සහ ඔවුන්ගේ ළමයින්ට දයාන්විත පරිසරයන් තුළ ඉගෙනීමට හා සංවර්ධනය වීමට අවස්ථාව සලසා දීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය සමඟ සහ පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සමඟ සමීප සම්බන්ධතාවයෙන් කටයුතු කළ යුතුය.

- **ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කළමනාකාරීත්වය**

ළමා දිවා සුරැකුම් පහසුකම් සපයා දීමේ දී ප්‍රධාන ම පාර්ශ්වකරුවෙක් වන එම පහසුකම්වල කළමනාකාරීත්වය ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ප්‍රමිති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ව්‍යුහාත්මක ගුණාත්මකභාවය (යටිතල පහසුකම් සහ අවකාශය; සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධ විධිවිධාන; වැඩිහිටි - ළමා අනුපාත සහ කණ්ඩායම්වල විශාලත්වය; කාර්ය මණ්ඩලයේ සුදුසුකම්;

සේවක වැටුප් යනාදිය[24]) සහ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය (ළමා දිවා සුරැකුම් පහසුකම් පරිසරය තුළ ළමයින් දෛනිකව ලබන අත්දැකීම්) සම්බන්ධයෙන් එම මධ්‍යස්ථානවල කළමනාකාරිත්වය වගකිව යුතු වන්නේය. ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ළමා සංවර්ධනයට සෘජුවම බලපාන සාධක වන, ළමා ක්‍රියාකාරකම් වල සමාජ, චිත්තවේගාත්මක, ශාරීරික හා උපදෙස් ලබාදීම යන අංශවලින් සහ රැකවරණය සපයන්නන්, සම වයසේ මිතුරන් හා ද්‍රව්‍ය සමඟ අන්තර් ක්‍රියාකිරීම්වලින් සමන්විත වේ. ළමා දිවා සුරැකුම් පහසුකම්වල කළමනාකාරීත්වය අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට නියෝජනය ලබාදෙන අතර මෙම ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා එම කමිටුව සමඟ එක්ව කටයුතු කළ යුතු වේ.

- **දෙමාපියන්/ භාරකරුවන්, පවුල සහ ග්‍රාමීය ළමා ආරක්ෂක කමිටු**

දෙමාපියන් සහ රැකවරණය සපයන්නන් ළමයින්ගේ එදිනෙදා කටයුතුවල හවුල්කරුවන් වන විට ළමයින් සාර්ථක වේ.[25] ළමයාගේ අනන්‍යතාවය ඔහුගේ/ඇයගේ පවුල තුළ මුල් බැසගෙන ඇති හෙයින්, දෙමාපියන් ගුරුවරුන් කෙරෙහි විශ්වාසය තබන බවත්, අනෙක් අතට ගුරුවරුන් දෙමව්පියන් කෙරෙහි විශ්වාසය තබන බවත්, ඔවුන් අතර අන්‍යෝන්‍ය ගෞරවයක් ඇති බවත් ළමයින් දැනගත් විට ළමයින්ට සුරක්ෂිත බවක් දැනෙයි. ළමා දිවා සුරැකුම් සේවාවන්හි ප්‍රතිලාභීන් ලෙස සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහි බිම් මට්ටමේ පාර්ශ්වකරුවන් වශයෙන් දෙමාපියන්ගේ/භාරකරුවන්ගේ, පවුල්වල සහ ගම් මට්ටමින් ළමා ආරක්ෂාව උදෙසා කටයුතු කරනු ලබන ග්‍රාමීය ළමා ආරක්ෂක කමිටුවල නියෝජනය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට ලබාදිය යුතු වේ. මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් අනෙකුත් පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කළ යුතුය.

- **රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යභාරය**

ළමා ආරක්ෂාව සහ සංවර්ධනය සම්බන්ධයෙන් මෙරට තුළ ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයන් ද මෙම ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී කාන්තා හා ළමා සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශය සමඟ සහ පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සමඟ සමීප සම්බන්ධතාවයෙන් කටයුතු කළ යුතුය.

Final Draft NCPA

[24]බොනෙටි, එස්. (2018) මුල් වසරවල ගුණාත්මක සපයාදීම්වල ව්‍යුහාත්මක අංග: සාක්ෂිවල සමාලෝචනයක්, තොරතුරු ලබා ගත් වෙබ් අඩවියhttps://epi.org.uk/wp-content/uploads/2018/08/Early-years-structural-quality-review_EPI.pdf

[25]තොරතුරු ලබා ගත් දිනය සහ වෙබ් අඩවිය: 2021 ජූලි 8, https://childwatch.com/blog/2018/11/02/family-engagement-a-partnership-between-childcare-centers-and-families/